

# 1 වැනි පරිච්ඡේදය

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති









## 1.1 2006 වසරේ සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායීතාව සහ ප්‍රතිපත්ති සඳහා ප්‍රතිචාර

ශ්‍රී ලංකා ආර්ථිකය, 2006 වසරේදී 1978 න් පසුව වාර්තාවූ ඉහළම ආර්ථික වර්ධනය වන සියයට 7.4 ක් සහ මෙතෙක් පැවති අඩුම සේවා වියුක්ති අනුපාතිකය වන සියයට 6.5 ක් සනිටුහන් කරමින් එහි අඛණ්ඩ වර්ධන ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගනු ලැබීය. මෙම යහපත් වර්ධනයන් පැවතිය ද, නැගී එමින් පැවති උද්ධමනකාරී තර්ජනය ප්‍රතිපත්ති සම්පාදකයින්ට දැඩි අභියෝගයක් විය. එබැවින්, මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩව යොමුවූයේ ඉහළ නගිමින් පැවති උද්ධමන පීඩනය සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහාය. මිල ස්ථායීතාවට පැවති මෙකී තර්ජනයන් මධ්‍යයේ, මූල්‍ය අංශයේ පැවති යහපත් ලක්ෂණයක් වූයේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට ඇති ශක්තිය විදහා දක්වමින් අඛණ්ඩව වර්ධනය වීමයි.


ආර්ථිකය මුහුණ දුන් ප්‍රධාන අභියෝග වූ ජාත්‍යන්තර බනිජ තෙල් මිල ගණන් ඉහළම මට්ටමක පැවතීම, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ඉහළයාම, ත්‍රස්තවාදයට එරෙහි ක්‍රියා මාර්ග වැඩි කිරීමට සිදුවීම, ගංවතුර සහ නායයෑම් වැනි ස්වාභාවික ව්‍යසන ඇතිවීම, පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු වේගවත් කිරීමේ අවශ්‍යතාව සහ අපනයන සඳහා වෙළෙඳපොළ පැවැති ඉහළ තරගකාරීත්වය වැනි විවිධ ගැටලු මධ්‍යයේ ආර්ථිකය අත්කරගත් වර්ධනීය තත්ත්වය ප්‍රසංසනීය වේ. රටේ ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 1,355 දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ විදේශ තරගකාරීත්වය ඉහළ යාමත් සමඟ අපනයන අඛණ්ඩව වර්ධනය වූ අතර, ආර්ථිකයේ ධාරිතා ප්‍රසාරණයට තවදුරටත් පහසුකම් සලසමින් ආනයන ඉහළ ගියේය. මෙතෙක් වාර්තාවූ ඉහළම වර්ධනය සහිත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සෘජු විදේශීය ආයෝජන මගින් වූ ලැබීම් මෙන්ම ඉහල මට්ටමක පැවති රජයට ලැබුණ විදේශ මූල්‍යන මගින්, ඉහළ යමින් පැවැති වෙළෙඳ හා ජංගම ගිණුම්වල හිඟය මූල්‍යනය කෙරුණු අතර, 2006 වසර අවසානය වනවිට සමස්ත ගෙවුම් තුලනයේ ඩොලර් දශ ලක්ෂ 204 ක අතිරික්තයක් වාර්තා විය. බහුවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ඉහළ රාජ්‍ය ආයෝජනයක් යොදවන ලද අතර, රාජ්‍ය ආදායම ඉහළයාම සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය පහත වැටීම හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ළඟාකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගත හැකි විය. වසරේ මුල් අවධිය තුළ දී වාර්තා වූ උද්ධමනය පහළ යාමේ ප්‍රවණතාව වෙනස් වී අප්‍රේල් මස සිට යළි වැඩිවීමක් දක්නට ලැබුණ අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉහළ මුදල් ප්‍රසාරණයයි. පාලන මිල ගණන්හි සිදුකරන ලද සංශෝධන ජීවන වියදමෙහි එක්වරක් සඳහා පමණක් වූ ඉහළ යාමකට බලපානු ලැබුවද, එය මුදල් ප්‍රසාරණය සඳහා ඇති අවස්ථා අවහිර කරමින් දිගුකාලීන වශයෙන් උද්ධමනය පාලනය කිරීම සඳහා වඩාත් ප්‍රතිඵලදායී වෙයි. මේ අතර, වසරේ දෙවැනි භාගය තුළදී පැවති අයහපත් කාලගුණ තත්ත්වයන් සැපයුම් කටයුතු සඳහා බාධාකාරී තත්ත්වයක් ඇති කළ අතර, එමගින් මිල ගණන් ඉහළ යාමට පීඩනයක් පැවතිණි. ඇතැම් විචක්ෂණශීලි ක්‍රියා මාර්ගවල ද සහයෝගය සහිතව, අඛණ්ඩව දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම හේතුවෙන්, ඉල්ලුම් පීඩන තුළින් ඇති වූ උද්ධමනය යම්තාක් දුරකට පාලනය කරන ලදී. 2007 වසර අවසානය වනවිට උද්ධමනය එක් අංකයක මට්ටමට පහත හෙළීමේ අරමුණ සහිතව 2007 වසර ආරම්භයේදී මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියා මාර්ග හඳුන්වාදෙන ලදී. විශේෂයෙන් කොටස් වෙළෙඳපොළ සහ විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉහළ ගනුදෙනු පරිමාවන් තුළින් නිරූපණය වන පරිදි, මූල්‍ය වෙළෙඳපොළ තවදුරටත් පුළුල් විය. මූල්‍ය පද්ධතිය තුළ කම්පනයන්ට ඔරොත්තුදීම සඳහා ඇති හැකියාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ නීතිමය ප්‍රතිපාදන හඳුන්වාදීමත්, විචක්ෂණ නියම පුළුල් කිරීමත් ඇතුළුව, මූල්‍ය අංශයේ යටිතල පහසුකම් තවදුරටත් ශක්තිමත් කිරීම 2006 වසර තුළදි සිදු විය.

**ඵලදායීතාව අඛණ්ඩව වර්ධනය වීම තිරසාර ඉහළ ආර්ථික වෘද්ධියක් සහ අඩු උද්ධමනයක් අත්කර ගැනීමට තිබිය යුතු මූලික අවශ්‍යතාවකි.** ඵලදායීතාවය වර්ධනය සඳහා බලපාන මූලික අංගයක් වන්නේ යටිතල පහසුකම් වර්ධනය, දියුණු තාක්ෂණය වර්ධනය, මානව ප්‍රාග්ධනය වර්ධනය සහ පර්යේෂණ කටයුතුවල වර්ධනයයි. ව්‍යාපාර මට්ටමෙහි ඵලදායිතා වර්ධනයක් ඇතිකළ හැකි පරිසරයක් බිහිකිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් වර්ධනය කිරීම අවශ්‍ය වේ. ජාත්‍යන්තර තරගකාරිත්වය වැඩිවීම, ආරක්ෂණයන් සැපයීම සඳහා තිබෙන සීමාවන් සහ තරග කාරිත්වය වැඩි කිරීම සඳහා ශ්‍රම හමුදාවේ ඵලදායිතාවය වර්ධනය කිරිමේ අවශ්‍යතාවය යන කරුණු පිළිබඳව සියලුම නිෂ්පාදන අංශ සැලකිල්ලට ගතයුතු ය. එවැනි ඵලදායීතා වර්ධනයක් උද්ධමනය අඩු කිරීමටත්, ඒ අනුව වැටුප් වැඩි කිරීම සඳහා සම්පත් යෙදවීමේ අවශ්‍යතාවයක් ඇති නොවීමටත් ජාත්‍යන්තර තරගකාරිත්වය ඉහළ

**1.1 රූප සටහන** ආර්ථික වර්ධනය සහ සේවා වියුක්තිය




**1.2 රූප සටහන** ඉතිරිකිරීම් සහ ආයෝජන



**විශේෂ සටහන 1**

## 2007 සහ ඉන් ඉදිරියට උද්ධමනාත්මක පීඩනය අඩුකිරීම සඳහා ක්‍රියාමාර්ග

මහ බැංකුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම සැලකිල්ලට ගෙන, මුදල් සැපයුමේ වර්ධනය මූර්ත නිෂ්පාදිතයේ වර්ධනය හා ගැලපෙන මට්ටමක පවත්වා ගනිමින් උද්ධමනාත්මක නොවන ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම පිණිස මහ බැංකුව ප්‍රතිපත්ති ක්‍රමෝපායයක් සකස් කර දැනට එය ක්‍රියාත්මක වෙමින් පවතී. 2007 සහ ඉදිරි කාලය සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රමෝපායයන් සකස් කිරීමේ දී සැලකිල්ලට ගැනීමට සිදු වූ ප්‍රධාන සාධක දෙකක් වූයේ 2006 වර්ෂය තුළ මුදල් සැපයුමේ පැවති ඉහළ වර්ධනය සහ උද්ධමනය ශීඝ්‍රයෙන් ඉහළ යාමයි. කාලපරිච්ඡේදය අවසානයේ දී අපේක්ෂිත අගයන් මත පදනම් වූ කාර්තුමය සංචිත මුදල් ඉලක්ක වි.ස. 1.1 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. සාමාන්‍යයෙන් මුදල් ඉලක්ක සකස් කෙරෙනුයේ කාලපරිච්ඡේදය අවසානයේ අගයන් මත වුවද, දිගු සති අන්ත හේතුවෙන් ඇතිවන විශාල දෛනික විචලනයන් හා සංචිත අවශ්‍යතා ගණන් බලන සතියෙහි අවසාන දින සංචිත මුදල් ප්‍රමාණය සාමාන්‍ය රටාවෙන් වෙනස්වීම හේතුවෙන් කාලපරිච්ඡේදය අග සංචිත මුදල් ප්‍රමාණය ඇතැම් විටෙක නොමග යවන සුළු විය හැකිය. එමෙන්ම, උද්ධමනාත්මක බලපෑම විශේෂයෙන්ම කාලපරිච්ඡේදය අවසානයෙහි වන අගයට වඩා මාසික සාමාන්‍යය සමග සහසම්බන්ධතාවක් පැවතීම හේතුවෙන්, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි සාර්ථකත්වය ඇගයීම සඳහා ඉලක්කයන් සත්‍ය මාසික සාමාන්‍යයන් සමග සැසඳීම වඩාත් උචිත බව පෙනීයයි.

සංඛ්‍යා සටහන වි.ස. 1.1

**සංචිත මුදල් කාර්තුමය ඉලක්ක**

| | 2006 සත්‍ය අගයන් | 2007 ඉලක්ක | | | |
|---|---|---|---|---|---|
| | දෙසැ: | මාර්තු | ජූනි | සැප්: | දෙසැ: |
| **සංචිත මුදල් (රුපියල් බිලියන )** | 239.8 | 254.6 | 250.4 | 257.8 | 267.1 |
| **ලක්ෂ්‍යමය වෙනස (මාසය අවසානයේ දී %)** | 21.2 | 17.3 | 17.9 | 16.1 | 11.6 |

මැදිකාලය සඳහා සකස් කරන ලද මුදල් වැඩසටහන (Monetary Programme) රජයෙහි මැදිකාලීන වර්ධන ඉලක්කයන් මත පදනම්ව ඇත. එම නිසා, කාලපරිච්ඡේදය තුළ දී උද්ධමනය අඩු හා ස්ථායී මට්ටමකට ගෙන ඒමට මුදල් සැපයුමෙහි වර්ධනය සීමා කළ යුතුව ඇත. ඒ අනුව, දිගුකාලීන ප්‍රතිපත්තියක් ලෙස උද්ධමනය ඉදිරි වසර 10 ක කාලපරිච්ඡේදය තුළ දී සියයට 4 ක මට්ටමට ක්‍රමයෙන් අඩු කිරීමට ඉලක්ක කර ඇති අතර, රජයේ දස අවුරුදු දැක්මට අනුකූලව මෙය සකස් කර ඇත.

මහජනයාට තොරතුරු කලින් ලබාදීම තුළින් ප්‍රතිපත්ති පුරෝකථන කිරීමට ඇති හැකියාව මෙන්ම ඒවායෙහි විනිවිදභාවය වර්ධනය කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් 2007 ජනවාරි මස 02 වන දින "2007 වර්ෂය හා ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" ප්‍රකාශයට පත්කරන ලදී[1]. එහි 2006 වර්ෂය තුළ ආර්ථිකයේ වර්ධනයන්, මුදල් සහ මූල්‍ය අංශ සම්බන්ධව ගනු ලැබූ ප්‍රතිපත්ති, 2007 වර්ෂයේ මුදල් ප්‍රතිපත්ති අරමුණු සහ මූල්‍ය ස්ථායීතාව ළඟා කර ගැනීමට ඇති අභියෝග, 2007 සහ ඉදිරිය සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රමෝපායයන්, 2007 සහ ඉදිරිය සඳහා මූල්‍ය පද්ධති ස්ථායීතාවය සඳහා වූ ප්‍රතිපත්ති සහ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ඇතුළත් වේ.

මෙම ප්‍රතිපත්ති පෙර දැක්මෙහි පෙන්වා දී ඇති පරිදි, 2007 වර්ෂයෙහි මුදල් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ආර්ථිකයෙහි සංවර්ධනය නියෝජනය කරන අනෙකුත් අංශයන් වන විදේශීය, රාජ්‍ය මූල්‍ය සහ මුදල් යන අංශයන් හි ප්‍රධාන සාර්ව ආර්ථික ඉලක්ක ඉටුකර ගැනීම තුළින් පහසුකම් සැලසීම අවශ්‍ය වේ. එබැවින්, 2007 ඉලක්ක ළඟා කර ගැනීම සහතික කරනු වස් මෙම අංශයන්හි ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් සඳහා වන අධීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත. එම ප්‍රධාන විචල්‍යයන් වි.ස. 1.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

සංඛ්‍යා සටහන වි.ස. 1.2

**අධීක්ෂණ යාන්ත්‍රණයේ ප්‍රධාන විචල්‍යයන්**

1. මහ බැංකුවේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත
2. රජයේ ආදායම
3. රජයේ පුනරාවර්තන වියදම
4. රජයේ ප්‍රාථමික අයවැය ශේෂයෙහි අගය
5. රජයේ අයවැයෙහි ශුද්ධ දේශීය මූල්‍යනය
6. මහ බැංකුවෙහි සංචිත මුදල්
7. මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්හි ඇති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම
8. රජය බැංකු ක්‍රමයෙන් ශුද්ධ ණය ගැනීම්
9. බැංකු ක්‍රමය තුළින් රාජ්‍ය සංස්ථා ලබාගත් ණය

රජය සහ මහ බැංකුව මෙම විචල්‍යයන්ගේ වර්ධනයන් පිළිබඳව මාසික පදනමක් මත අධීක්ෂණය කිරීම සඳහා දැනටමත් යාන්ත්‍රණයක් සකස් කර ඇති අතර, එමගින් අපේක්ෂිත ඉලක්කයන්හි සිදුවිය හැකි වෙනස්වීම් අවම කිරීමටත් එමගින් යම් විශාල වෙනස්වීමක් වීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා කඩිනම් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමටත් අපේක්ෂා කෙරේ.

---

1 මෙම සම්පූර්ණ වාර්තාව මහ බැංකුවේ වෙබ් අඩවිය වන "www.cbsl.lk" හි ප්‍රකාශයට පත්කර ඇත.


මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා තවත් පියවරක් වශයෙන් 2007 ජනවාරි මස 02 වන දින ප්‍රතිපත්ති ඉදිරි දැක්ම මගින් ප්‍රකාශයට පත්කරන ලද පරිදි පෞද්ගලික අංශය නියෝජනය කරන ආර්ථික සංවර්ධනයට දායකවන්නන් සහ අර්ථ ශාස්ත්‍රඥයින් හත් දෙනෙකුගෙන් සමන්විත මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් (Monetary Policy Consultative Committee) 2007 ආරම්භයේ දී පිහිටුවනු ලැබීය. මුදල් ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුවේ සාමාන්‍ය මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ දී මෙම පෞද්ගලික අංශයේ සාමාජිකයන්ගේ පරිණතභාවය සහ දැනුම උපයෝගී කර ගැනීමට අපේක්ෂා කෙරේ. මුදල් ප්‍රතිපත්ති කටයුතු සඳහා එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවද මීට සමාන කමිටුවක් පත් කරන බව 2007 ජනවාරි 17 වන දින ප්‍රකාශයට පත් කළේය.[2]

මෙම සියලු අංශවල ඇඩි හා ඒකාබද්ධ උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් තිරසාර ඉහළ ආර්ථික වර්ධනයට ඉඩ සලසන අඩු හා ස්ථායී උද්ධමනයක් ඉදිරි වසරවල දී ළඟා කරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2007 හා 2008 වසරවල දී මතුපිට උද්ධමනයේ අපේක්ෂිත හැසිරීම පහත රූපසටහනින් දැක්වේ.

[2]The Wall Street Journal, 17 January 2007, "Central Bankers, Economists to meet in New Forum on Monetary Policy."

රූප සටහන වි.ස. 1.1

මතුපිට උද්ධමනය 2007-2008 සඳහා පුරෝකථන




නැංවීමටත් උපකාරී වනු ඇත. අවධානය යොමු විය යුතු වැදගත් කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ ඵලදායීතා වර්ධනය විශේෂයෙන් ආසියාව ඇතුළු නැගී එන ආර්ථිකයන්හි මට්ටමට වඩා පහළින් පවතින බවයි. පසුගිය කාලයේ ලංකාවේ ඵලදායීතා වර්ධනය ඉහළ මට්ටමක පැවතුණි නම්, ලංකාවට ඉහළ ඒකපුද්ගල ආදායමක් සහ අඩු උද්ධමන තත්ත්වයක් භුක්ති විඳිය හැකිව තිබුණි.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන, 2006 - 2016 දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි දක්වා ඇති ආකාරයට, මැදිකාලීනව සියයට 8 කට වඩා වැඩි තිරසාර ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට අඛණ්ඩව ප්‍රයත්න දැරිය යුතු වේ. දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සකස් කරනු ලැබූයේ *මහින්ද චින්තන* සමස්ත ප්‍රතිපත්ති දර්ශනය අනුව යමින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ ඒකායන උපදේශාත්මක ක්‍රියාවලියක් තුළිනි. සමස්ත ප්‍රතිපත්ති උපාය මාර්ගය සැලසුම් කර ඇත්තේ දේශීය ව්‍යවසායයන්ට අවශ්‍ය සහයෝගය සැපයීම තුළින් වෙළෙඳපොළ මත පදනම් වූ ආර්ථික ප්‍රතිපත්තීන්හි ධනාත්මක ගුණාංග දේශීය අභිලාෂයන් සමග ඒකාබද්ධ කිරීමට සහ විදේශීය ආයෝජන දිරිමත් කිරීමට හැකිවන ලෙසය. තිරසාර හා වඩාත් පුළුල් පදනමක් සහිත ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, වසර 2016 වනවිට සියයට 4 ක පමණ අඩු සහ ස්ථායී උද්ධමන වේගයක් පවත්වා ගැනීම, අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 4 කට වඩා අඩු මට්ටමකට පහත හෙළමින් සහ රාජ්‍ය ණය සියයට 50 ක පමණ මට්ටමකට ගෙන එමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ළඟාකර ගැනීම දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි ඉලක්ක වේ.

මෙම ප්‍රතිපත්ති ක්‍රමෝපායයන් ප්‍රධාන වශයෙන් යොමුව ඇත්තේ අඛණ්ඩ බල ශක්ති සැපයුම, සන්නිවේදන සේවා, පානීය සහ වාරිමාර්ග ජල පහසුකම්, මහා මාර්ග, වරාය හා ගුවන් තොටුපළ සහ සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා යනාදියෙහි විශාල ප්‍රමාණයකින් ආයෝජනය කිරීම තුළින් එම යටිතල පහසුකම් සහ සේවාවල පවත්නා අඩුපාඩු සහ සීමාවන් පිළිබඳ ගැටලු විසඳීමටත්, එමගින් වර්ධන විභවතාවන් වැඩි දියුණු කිරීමත්ය. සංවර්ධනයට දායක වන ජාත්‍යන්තර ආයතන ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් විසින් දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව පිළිගනු ලැබ ඇති අතර, දැනටමත් සැලසුම් කොට ඇති සියළු යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මූල්‍යමය උපකාර කරමින් ඔවුන්ගේ කැපවීම ප්‍රදර්ශනය කොට ඇත.

**සැලසුම් කර ඇති යටිතල පහසුකම් ව්‍යාපෘති අදාළ කාලය තුළ ක්‍රියාත්මක කිරීම ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමට තිබිය යුතු මූලික අවශ්‍යතාවකි.** අතීත අත්දැකීම් තුළින් පැහැදිලි වන්නේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම නිසා අත්කරගෙන ඇති ආර්ථික වර්ධනය, අත්කර ගතහැකිව තිබූ ආර්ථික වර්ධනයට වඩා අඩු මට්ටමක පැවති බවයි. නව ප්‍රතිපත්ති උපාය මාර්ග තුළින් ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පවතින ගැටලුව මගහැරවීම සඳහා වැඩි අවධානයක් යොමුකර තිබීම දිරිමත් කරවන සුළු කරුණකි. ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති නියමිත කාලයට නිම කිරීම සඳහා වන එම උත්සාහයන් අඛණ්ඩව කරගෙන යාම අත්‍යවශ්‍ය වන අතර, එය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට උපකාරී වනු ඇත.

**දස අවුරුදු දැක්මෙහි ඇතුළත් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නම් රාජ්‍ය ව්‍යවසායයන්හි මෙහෙයුම් කටයුතුවල සැලකිය යුතු දියුණුවක් අත්කර ගැනීම කඩිනමින් කළයුතු වේ.** රාජ්‍ය ව්‍යවසායයන්, උපාය මාර්ගික වශයෙන් වැදගත් වන සේවාවන් ගණනාවක් කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු වන අතර, එම ප්‍රධාන ආයතන වන්නේ විදුලිබලය සපයන ලංකා විදුලිබල මණ්ඩලය, දුම්රිය සේවා සපයන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ජල සැපයුම සහ ජලාපවාහන සේවා සපයන ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනයෙන් සියයට 80 ක් පමණ (රටේ සමස්ත ආනයනවලින් සියයට 20 ක්) ආනයනය කිරීම හා බෙදාහැරීම කරන ලංකා ඛනිජ තෙල් සංස්ථාව, සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක බැංකු සේවා සැපයීම සිදු කරන රාජ්‍ය වාණිජ බැංකු දෙක සහ බස් රථ ප්‍රවාහනයෙන් සියයට 30 කට පමණ දායකවන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයයි. එවැනි තත්ත්වයක් තුළ, එම රාජ්‍ය ව්‍යවසායයන් විසින් අනාගතය සඳහා අඩු පිරිවැය සහිත කාර්යක්ෂම යටිතල පහසුකම් ලබා දෙමින් මහජනතාවට සපයන සේවාවන් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු නොකරන්නේ නම්, රජය එම ආයතන පෞද්ගලිකකරණය නොකරන්නේය යන්න පිළිබඳව සහතිකවීම, ඔවුන් විසින් ඒකාධිකාරී හෝ විශාල වෙළෙඳපොළ කොටසක් භුක්ති විඳින තත්ත්වය තවදුරටත් පවත්වා ගෙන යාමට ආවරණයක් ලෙස භාවිතා නොකළ යුතු ය. බදු ගෙවන්නන් මත බරක් නොවී ජනතාවට මනා ගුණාත්මක සේවාවක් සපයන අතරම, රජය වෙත ප්‍රමාණවත් ආදායමක් ලබා දෙමින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කිරීමට එම ආයතනවල ඇති කැපවීම, රජයේ පෞද්ගලිකකරණය නොකිරීමේ ප්‍රතිපත්තිය නිසා තවදුරටත් වැඩි විය යුතුව ඇත. ජාත්‍යන්තර වශයෙන් තරගකාරී මට්ටමකින් මෙම සේවා සැපයීම, ආර්ථික වර්ධන ඉලක්ක අත්පත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථිකයන්හි තිබිය යුතු පූර්ව අවශ්‍යතාවයක් වන අතර, ජාත්‍යන්තර වෙළෙඳපොළට භාණ්ඩ හා සේවා අපනයනය කිරීමේ දී තරගකාරීත්වයට මුහුණදීම සඳහා රට සතු හැකියාව ඒ මත ඇඩිව රඳා පවතී. දස අවුරුදු දැක්ම, මෙම සේවාවන්හි වැදගත්කම පිළිබඳව පැහැදිලිවම හඳුනාගෙන ඇති අතර, රාජ්‍ය ව්‍යවසායයන් මගින් පාලනය කරනු ලබන යටිතල පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය ආයෝජනයෙන් වැඩි කොටසක් වෙන්කොට ඇත. රජය මෙම ආයතනයන්හි හිමිකරු ලෙස එම ව්‍යවසායයන් පාලනය කිරීම සඳහා පත්කළ නියෝජිතයන් සහ හෝ මණ්ඩල මත රඳා පැවතීමට රජයට සිදු වේ. මේ අනුව. මෙම ව්‍යවසායයන් පාලනය කරනු ලබන නියෝජිතයන් ආයතනමය හෝ ස්වකීය ප්‍රතිලාභ හෝ ගැන පමණක් නොසිතා රටට ප්‍රතිලාභ ලැබෙන ආකාරයට ආයතන පවත්වා ගෙන යන බව තහවුරු කිරීම සඳහා යාන්ත්‍රණයක් පැවතීම අවශ්‍ය වේ. ඒ අනුව, මෙම ව්‍යවසායයන් මත රජය විසින් කරනු ලබන සුවිශාල ආයෝජනයන්ට සරිලන ප්‍රතිලාභයක් ලබාදීම සහ ප්‍රමාණවත් මට්ටමක අනාගත මුදල් ප්‍රවාහ

**1.1 සංඛ්‍යා සටහන**

**ස්ථාවර මිල යටතේ (1996) දළ ජාතික නිෂ්පාදිතය**

| අංශය | වටිනාකම (රු.ද.ල) | | ද.දේ.නි.% ලෙස | | වෙනස්වීමේ අනුපාතිකය% | | වෙනස්වීමේ දායකත්වය% | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2005(අ) | 2006(ආ) | 2005(අ) | 2006(ආ) | 2005(අ) | 2006(ආ) | 2005(අ) | 2006(ආ) |
| **කෘෂිකාර්මික අංශය** | **179,278** | **187,729** | **17.2** | **16.8** | **1.9** | **4.7** | **5.8** | **11.1** |
| කෘෂිකර්මය | 148,712 | 149,506 | 14.3 | 13.4 | 9.4 | 0.5 | 21.6 | 1.0 |
| දැව | 17,400 | 18,253 | 1.7 | 1.6 | 1.7 | 4.9 | 0.5 | 1.1 |
| ධීවර | 13,166 | 19,970 | 1.3 | 1.8 | -42.2 | 51.7 | -16.3 | 8.9 |
| **කාර්මික අංශය** | **280,868** | **300,982** | **27.0** | **27.0** | **8.3** | **7.2** | **36.6** | **26.3** |
| පතල් හා කැනීම් කටයුතු | 19,334 | 20,888 | 1.9 | 1.9 | 14.1 | 8.0 | 4.0 | 2.0 |
| නිමැවුම් කර්මාන්ත | 169,336 | 178,359 | 16.3 | 16.0 | 6.0 | 5.3 | 16.3 | 11.8 |
| විදුලිය සහ ජලය | 17,784 | 21,368 | 1.7 | 1.9 | 24.5 | 20.2 | 5.9 | 4.7 |
| ඉදිකිරීම් | 74,414 | 80,367 | 7.2 | 7.2 | 8.9 | 8.0 | 10.3 | 7.8 |
| **සේවා අංශය** | **579,618** | **627,504** | **55.7** | **56.2** | **6.2** | **8.3** | **57.6** | **62.6** |
| තොග සහ සිල්ලර වෙළෙඳාම, හෝටල් සහ අවන්හල් | 225,103 | 238,322 | 21.6 | 21.4 | 2.8 | 5.9 | 10.3 | 17.3 |
| ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 159,484 | 180,307 | 15.3 | 16.2 | 11.7 | 13.1 | 28.4 | 27.2 |
| මූල්‍ය සේවා, දේපළ වෙළෙඳාම් සහ ව්‍යාපාරික සේවා | 122,127 | 133,958 | 11.7 | 12.0 | 6.5 | 9.7 | 12.6 | 15.5 |
| රාජ්‍ය පරිපාලනය, අනෙකුත් රාජ්‍ය සේවා සහ ආරක්ෂක කටයුතු අනෙකුත් ප්‍රජා, සමාජයීය සහ පෞද්ගලික සේවා | 72,903 | 74,918 | 7.0 | 6.7 | 5.4 | 2.8 | 6.4 | 2.6 |
| **දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **1,039,763** | **1,116,215** | **100.0** | **100.0** | **6.0** | **7.4** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | -16,526 | -21,666 | | | -46.2 | -31.1 | | |
| දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි) | 1,023,237 | 1,094,550 | | | 5.6 | 7.0 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ජනිත කිරීමට ඔවුන්ගේ ඇති කැපවීම තහවුරු කිරීම සඳහා රජය විසින් රාජ්‍ය ව්‍යවසායයන් ගෙන් දැඩි සහතිකයක් ලබා ගැනීම අත්‍යවශ්‍යය. එබඳු ආකාරයක කැපවීමක් නොමැතිවීම තුළින් රාජ්‍ය මූල්‍ය සහ ණය ස්ථායිතාව අයහපත් මට්ටමකට පත්කරනු ඇති අතර, එය දස අවුරුදු දැක්මෙහි ඇතුළත් මධ්‍යකාලීන සාර්ව ආර්ථික ස්ථායිතාව කෙරෙහි ද අහිතකර ලෙස බලපානු ඇත.

**සියලු අංශ හිතකර ලෙස වර්ධනය වීම හේතුවෙන් 2006 ආර්ථික වර්ධනය පුළුල් පදනමක් මත සිදු විය.** සමස්ත වර්ධනයට සියයට 11.1 ක දායකත්වයක් ලබා දෙමින් කෘෂිකාර්මික අංශය සියයට 4.7 කින් වර්ධනය වූ අතර, සමස්ත වර්ධනයට සියයට 27 ක දායකත්වයක් ලබා දෙමින් කාර්මික අංශය සියයට 7.2 කින් වර්ධනය විය. වසර තුළදී සේවා අංශය සියයට 8.3 කින් වර්ධනය වූ අතර, එම අංශයේ දායකත්වය සියයට 62.4 ක ඉහළ අගයක් ගනු ලැබීය.

**රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සහයෝගීතාව ශක්තිමත්වීම සහ හිතකර කාලගුණික තත්ත්වය තුළින් ප්‍රතිලාභ ලැබ 2006 වර්ෂය තුළදී කෘෂිකාර්මික අංශය තවදුරටත් යථා තත්ත්වයට පත් විය.** වැසි ආවරණ භාවිතය, බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සහ හරිතාග ආදී නව්‍ය තාක්ෂණික උපාය මාර්ග භාවිතය තුළින් ඵලදායිතාව නැංවීමේ උත්සාහයන්, භූමි සහ ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතය සඳහා නැඹුරුවීම, සහන මිල ගණන් යටතේ බීජ සහ පොහොර වැනි යෙදවුම් ලබා ගැනීමට ඇති හැකියාව, කෘෂිකාර්මික කටයුතු සඳහා ණය පහසුකම් සම්පාදනය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන නවීන යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම සඳහා බදු සහන ලබාදීම ආදිය මේ සඳහා දායක විය. පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය ඉහළ යාම සහ කිරි ගොවීන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ඇතුළුව රජය විසින් විවිධ දිරිගැන්වීම් සහ උපකාර ලබාදීම හේතුවෙන් පශු සම්පත් අංශය මනා ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. ඉරිඟු, ලොකු ළූණු හා සෝයා බෝංචි වැනි වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය ද දේශීය නිෂ්පාදනය දිරි ගැන්වීමේ ක්‍රියා මාර්ග හේතුවෙන් ඉහළ වර්ධනයක් වාර්තා කළේය. පසු අස්වනු මෙහෙයුම් සම්බන්ධතා, ප්ලාස්ටික් ඇසුරුම් වැනි උපකරණ සැපයීම, ගොවීන් සඳහා තාක්ෂණික උපදෙස් සැපයීම සහ වෙළෙඳපොළ පහසුකම් වැඩි දියුණු කිරීම් ආදිය ද කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළයාම කෙරෙහි බලපාන ලදී. පොහොර සහනාධාර සහ හිතකර කාලගුණික තත්ත්වයෙන් ප්‍රතිලාභ ලබමින්, 2006 දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශලක්ෂ 3.3 ක වාර්තාගත මට්ටමක් කරා ළඟා විය. කෙසේ වුවත්, රජය ක්‍රියාත්මක කරනු ලැබූ වී මිලදී ගැනුම් ක්‍රමයෙහි සීමාවන් හේතුවෙන්, ගොවීහු තවදුරටත් අලෙවිකරණ ගැටලුවලට මුහුණ දුන්හ. ආකර්ෂණීය මිල ගණන් සහ ඵලදායිතා වර්ධනය හේතුවෙන් රබර් නිෂ්පාදනය 1996 න් පසු පැවති ඉහළම මට්ටම වාර්තා කළේය. සුනාමි ව්‍යසනයත් සමග ඇති වූ පසුබෑමෙන් අනතුරුව, මත්ස්‍ය නිෂ්පාදනය අඛණ්ඩව යථා තත්ත්වයට පත් විය. කෙසේ වුවද, සේවක අර්බුදවලින් තේ නිෂ්පාදනය සුළු වශයෙන් අඩුවීම සඳහා බලපෑමක් ඇතිවිය.

**කෘෂිකර්මාන්තයෙහි තිරසාර වර්ධනය සඳහා ඵලදායිතාව ඉහළ නැංවීම, අලෙවිකරණ සහ අදාළ යටිතල පහසුකම් සැපයීම, අනුරූපී වෙළෙඳ ප්‍රතිපත්තීන් ක්‍රියාවෙහි යෙදවීම, ග්‍රාමීය අංශයට මූල්‍යකරණ පහසුකම් සැපයීම සහ බෝග සහ පශු සම්පත්වල ඒකාබද්ධතාවය ඇති කිරීම අවශ්‍ය වේ.** කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් තවදුරටත් සංවර්ධනය කිරීම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම ශක්තිමත් කළ හැකිය. නව සොයාගැනීම්වල ප්‍රශස්ත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පර්යේෂකයන්, ව්‍යාප්ති සේවා සැපයුම්කරුවන්, සංවිධිත සාංගමික අංශය සහ ගොවීන් අතර, සමීප සහයෝගීතාවක් පැවතීම අවශ්‍ය වේ. ගොවීන් වඩා හොඳින් දැනුවත් කිරීම සඳහා තාක්ෂණික, ආර්ථික හා පාරිසරික තොරතුරු බෙදාහැරීම සඳහා මනා උපාය මාර්ගයක් අවශ්‍ය වේ. පසු අස්වනු නාස්තිය අවම කිරීම, ගොවීන්ට, අතරමැදියන්ට මෙන්ම පාරිභෝගිකයන්ටද වාසිදායක වනු ඇත. එකතු කළ අගය වැඩි කිරීම සඳහා ප්‍රවර්ධන සහ දිරිගැන්වීම් ලබාදීම කෘෂි පිරිසැකසුම් කර්මාන්තයෙහි රැකියා අවස්ථා උත්පාදනය සඳහා උපකාරී වේ. රජය දැනටමත් කෘෂිකාර්මික නිෂ්පාදන මිලදී ගැනීම සඳහා අධිකාරියක් ස්ථාපිත කර තිබේ. කෙසේ වුවත්, වී, විවිධ එළවලු වර්ග සහ අතිරේක ආහාර බෝග සඳහාවන මිල ගණන් අස්වනු නෙලන කාලයේදී අඛණ්ඩව පහළයාම තුළින් අලෙවිකරණ යාන්ත්‍රණය ප්‍රමාණවත් නොවන බව පෙන්නුම් කරයි. ඉදිරි මිලදී ගැනුම් ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම තුළින් පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ හවුල්කාරිත්වය වර්ධනය කිරීම සහ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම මගින් කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය තවදුරටත් ඉහළ නැංවිය යුතුව ඇත.

**සහනාධාර සැපයීමට වඩා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග වඩාත් ප්‍රතිඵලදායක වේ.** වී වැනි වෙළෙඳපොළ මිල අනුව සාපේක්ෂව අඩු එකතුකළ වටිනාකමක් සහිත නිෂ්පාදන සඳහා අඛණ්ඩව සහනාධාර සැපයීම තුළින් ගොවි ආදායම දීර්ඝකාලීන වශයෙන් ඉහළ නැංවීම සිදු නොවනු ඇති අතර, එම බෝගයන්හි ධාරිතා සීමාකම එයට හේතු වේ. එමෙන්ම, එබඳු ප්‍රතිපත්ති තුළින් කාලීන අවශ්‍යතාවක් වන බෝග විවිධාංගීකරණයට ද බාධා ඇති කෙරෙනු ඇත. ඒ අනුව, එකතු කළ අගය අඩු බෝග නිෂ්පාදන මත සහනාධාර සපයනු වෙනුවට වඩාත් ලාභදායී ඉහළ එකතු කළ අගයක් සහිත බෝග නිෂ්පාදනය සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා ගොවීන් උනන්දු කිරීම තුළින් භූමිය සහ ජලය වැනි සීමිත සම්පත්වලින් ප්‍රශස්ත ප්‍රතිලාභ ලැබිය හැකිය.

කම්හල් කර්මාන්ත නිෂ්පාදන සඳහා විදේශීය සහ දේශීය ඉල්ලුම ඉහළ යාම තුළින් කාර්මික අංශය ප්‍රතිලාභ ලැබීය. කම්හල් කර්මාන්ත අංශයේ වර්ධනය ප්‍රධාන වශයෙන්, රෙදිපිළි ඇඟලුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන, රබර් ආශ්‍රිත නිෂ්පාදන, ආහාර පාන වර්ග, සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන තුළින් ද, ඉදිකිරීම් අංශයෙහි ඇති වූ ඉහළ වර්ධනය මාර්ග හා අධිවේගී මාර්ග, විදුලි සංදේශ, නිවාස සහ දේපළ සංවර්ධන, හෝටල් සහ ආපනශාලා, විදුලි උත්පාදනය සහ සුනාමි ප්‍රතිසංස්කරන ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක වීම වැනි ක්ෂේත්‍රවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්හි ඉහළ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ද ජනිත විය. ඉදිකිරීම් අංශයේ වර්ධනය, සිමෙන්ති. පිඟන් භාණ්ඩ සහ ගොඩනැගිලි අමු ද්‍රව්‍ය ඇතුළු ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනවල ඉහළ වර්ධනය තුළින් පැහැදිලි විය. 2006 දී අපනයන වෙළෙඳපොළ තුළ දියමන්ති පිරි සැකසීම, මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය මනා ලෙස ක්‍රියාකාරී විය. පිරිවැය කළමනාකරණය තුළින් ශ්‍රම ඵලදායිතාව නැංවීම, නිෂ්පාදන විශේෂීකරණය, අත්පත් කර ගැනීම්, පිරිසැකසුම් ක්‍රියාදාම වර්ධනය කිරීම, තාක්ෂණික සංවර්ධනයන්, උපාය මාර්ගික ගිවිසුම් සකස් කිරීම, පසු බැඳුම් සම්බන්ධතා සංවර්ධනය කිරීම සහ අලෙවිකරණ විභවතාවන් වර්ධනය කිරීම හරහා 2006 දී කාර්මික අංශය ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ශ්‍රම සූක්ෂම කර්මාන්ත සම්බන්ධව ශ්‍රී ලංකාවේ සාපේක්ෂ වාසි අඩු වෙමින් පවතින හෙයින්, කාර්මික අංශයේ තිරසාර දිගුකාලීන වර්ධනයක් ඇති කිරීම සඳහා කාර්මික අංශය ගෝලීය වශයෙන් තරගකාරී, ගතික සහ තාක්ෂණික වශයෙන් වඩාත් දියුණු තත්ත්වයකට පරිවර්තනය වීම අවශ්‍ය වේ. එබැවින්, ලෝක වෙළෙඳපොළෙහි පවතින දැඩි තරගකාරීත්වයට මුහුණදීම සඳහා කාර්මික අංශය තවදුරටත් විවිධාංගීකරණය කිරීම සහ ඵලදායිතාවය වර්ධනය කිරීම අවශ්‍ය වේ. බහුවිධ කෙඳි ගිවිසුම (Multi-Fibre Arrangement - MFA) අහෝසි කිරීමෙන් පසුව කම්හල් කර්මාන්තය අංශය තුළ විශාලතම උප අංශය වන රෙදිපිළි, ඇඟලුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන අපනයන අංශය මෑත කාලයේදී ලෝක වෙළෙඳපොළ තුළ ප්‍රධාන වශයෙන්ම එක්සත් ජනපද වෙළෙඳපොළ තුළ, දැඩි තරගකාරීත්වයකට මුහුණ දෙනු ලැබීය. එසේ වුවද, රෙදිපිළි සහ ඇඟළුම් අංශය, විශේෂීකරණය සහ ඵලදායිතා වාසි තුළින් තරගකාරීත්වය හමුවේ සාර්ථකව ක්‍රියා කොට තිබේ. රෙදිපිළි සහ ඇඟළුම් අංශය තවමත් නව විදේශ ආයෝජන ආකර්ෂණය කර ගනිමින් පවතින අතර, එය එම අංශය කෙරෙහි පවතින ආයෝජක විශ්වාසය නිරූපණය කරයි. සේවා අංශයේ ඉහළ දායකත්වය සඳහා විදුලි සංදේශ, භාණ්ඩ ප්‍රවාහන සහ මූල්‍ය සේවාවන්හි සිදු වූ හිතකර වර්ධනය ඉවහල් විය. යටිතල පහසුකම් සංවර්ධනය සහ නිසි නියාමන යාන්ත්‍රණයන්ගෙන් යුක්ත ලිහිල්කරණයේ ප්‍රතිලාභ තුළින් මෙම අංශයන්ගේ වේගවත් අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කෙරේ.

මැදිකාලීනව සියයට 8 - 10 අතර ප්‍රමාණයක ආර්ථික වර්ධන වේගයක් අත්කර ගැනීම, ගෝලීය කර්මාන්ත, වෙළෙඳ සහ වාණිජ අවශ්‍යතාවයන්ට පහසුකම් සපයනු ලබන සක්‍රීය සේවා අංශයක් ස්ථාපිත කිරීම මත දැඩිව රඳා පවතී. මෙය දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි මනාව හඳුනා ගෙන ඇති බව මැදිකාලීනව සියයට 10-12 අතර ප්‍රමාණයක සේවා අංශයේ වර්ධනයක් අපේක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. ඉහළ සාක්ෂරතාවක් සහ පහසුවෙන් පුහුණු කළ හැකි ශ්‍රම බලකායක් සහිත ශ්‍රී ලංකාවට සේවා අංශය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සාපේක්ෂව වැඩි වාසිදායක තත්ත්වයක් පවතී. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් විෂයෙහි ආයෝජන ධෛර්යවත් කිරීම සහ දැනුම පදනම් වූ ගෝලීය සේවාවන් මත අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාවට සේවා පදනමක් සහිත ආර්ථිකයක් බවට පත්වීමට ඇති ශක්‍යතාවය ඉහළ නැංවෙනු ඇත. එමගින්, කාර්මික සහ කෘෂිකාර්මික යන දෙඅංශයටම අවශ්‍ය සේවා සැපයීම තුළින් එම අංශයන්හි ඵලදායීතාවය වර්ධනය කිරීමට සහ ඒ අනුව අපේක්ෂිත වර්ධන තත්ත්වය ළඟාකර ගැනීමට හැකිවනු ඇත.

දේශීය ඉතිරි කිරීම් වර්ධනය කිරීමේ සීමා පවතින වාතාවරණයක් තුළ, වඩාත් යෝග්‍ය ආර්ථික වර්ධන

**1.2 සංඛ්‍යා සටහන** — **සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් ආයෝජන පරතරය 2005-2006**

| ශීර්ෂය | රු. බිලියන | | වර්ධනය % | | ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2005 (අ) | 2006 (ආ) | 2005 (අ) | 2006 (ආ) | 2005 (අ) | 2006 (ආ) |
| 1. දේශීය ඉල්ලුම | 2,584.5 | 3,125.2 | 16.8 | 20.9 | 109.3 | 111.5 |
| 1.1 පරිභෝජනය | 1,957.0 | 2,321.9 | 14.8 | 18.6 | 82.7 | 82.9 |
| පෞද්ගලික | 1,761.9 | 2,068.5 | 14.4 | 17.4 | 74.5 | 73.8 |
| රාජ්‍ය | 195.1 | 253.4 | 18.3 | 29.9 | 8.2 | 9.0 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 627.5 | 803.4 | 23.5 | 28.0 | 26.5 | 28.7 |
| | 465.3 | 632.7 | 15.3 | 36.0 | 19.7 | 22.6 |
| පෞද්ගලික | 62.9 | 62.9 | 6.1 | 0.0 | 2.7 | 2.2 |
| රාජ්‍ය සංස්ථා | 99.3 | 107.8 | 119.2 | 8.5 | 4.2 | 3.8 |
| රාජ්‍ය | -218.9 | -323.4 | -18.7 | -47.7 | -9.3 | -11.5 |
| 2. ශුද්ධ බාහිර ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනය | 792.7 | 885.9 | 7.6 | 11.8 | 33.5 | 31.6 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය | 1,011.6 | 1,209.4 | 9.8 | 19.6 | 42.8 | 43.2 |
| | 2,365.6 | 2,801.8 | 16.6 | 18.4 | 100.0 | 100.0 |
| | 408.6 | 479.9 | 26.3 | 17.5 | 17.3 | 17.1 |
| 3. මුළු ඉල්ලුම (ද.දේ.නි) (1) + (2) | 472.2 | 550.1 | 17.4 | 16.5 | 20.0 | 19.6 |
| 4. දේශිය ඉතිරි කිරීම් (3) - (1.1) | -63.6 | -70.1 | -18.7 | -10.3 | -2.7 | -2.5 |
| පෞද්ගලික | -30.0 | -40.8 | -45.1 | -35.6 | -1.3 | -1.5 |
| රාජ්‍ය | | | | | | |
| 5. විදේශීය ශුද්ධ සාධක ආදායම | 174.4 | 215.1 | 27.7 | 23.3 | 7.4 | 7.7 |
| 6. විදේශීය ශුද්ධ පෞද්ගලික ජංගම සංක්‍රාම | 553.0 | 654.3 | 25.8 | 18.3 | 23.4 | 23.4 |
| 7. ජාතික ඉතිරි කිරීම් (4) + (5) + (6) | | | | | | |
| 8. ඉතිරි කිරීම් ආයෝජන පරතරය | -218.9 | -323.4 | | | -9.3 | -11.5 |
| දේශීය ඉතුරුම් - ආයෝජන (4)- (1.2) | -74.6 | -149.1 | | | -3.2 | -5.3 |
| ජාතික ඉතිරි කිරීම් - ආයෝජන | -74.6 | -149.1 | | | -3.2 | -5.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අනුපාතිකයක් ළඟාකර ගැනීමෙහිලා විදේශීය ආයෝජන සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ඇති වැදගත්කම 2006 වසර තුළ දී ආයෝජන වැඩිවීමත්, ඉතුරුම්-ආයෝජන පරතරය පුළුල්වීමත් තුළින් පිළිඹිඹු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දළ ආයෝජන 2005 දී සියයට 26.5 සිට 2006 දී සියයට 28.7 දක්වා ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් ආයක වූයේ පෞද්ගලික ආයෝජනයෙහි සිදු වූ ඉහළ යාමයි. ආයෝජනයේ සිදු වූ වැඩිවීම හා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික ඉතුරුම් සියයට 19.6 දක්වා

**1.3 සංඛ්‍යා සටහන** **විදේශීය අංශයේ සංවර්ධනයන්**

| | එ.ජ.ඩො. දශ ලක්ෂ 2005 | එ.ජ.ඩො. දශ ලක්ෂ 2006 | වර්ධනය % |
|---|---|---|---|
| **අපනයන** | **6,347** | **6,883** | **8.4** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 1,154 | 1,293 | 12.1 |
| කාර්මික නිෂ්පාදන | 4,948 | 5,383 | 8.8 |
| ඛණිජමය අපනයන | 143 | 136 | -5.1 |
| වෙනත් අපනයන | 101 | 70 | -30.8 |
| **ආනයන** | **8,863** | **10,253** | **15.7** |
| පාරිභෝගික භාණ්ඩ | 1,644 | 1,980 | 20.4 |
| අතරමැදි භාණ්ඩ | 5,317 | 5,962 | 12.1 |
| ආයෝජන භාණ්ඩ | 1,870 | 2,246 | 20.1 |
| වෙනත් | 32 | 65 | 100.7 |
| **වෙළෙඳ ශේෂය** | **-2,516** | **-3,370** | **34.0** |
| **සේවා, ශුද්ධ** | **338** | **257** | **-24.1** |
| ලැබීම් | 1,540 | 1,625 | 5.5 |
| ගෙවීම් | 1,202 | 1,368 | 13.8 |
| **ආදායම්, ශුද්ධ** | **-303** | **-388** | **28.0** |
| ලැබීම් | 35.6 | 311.2 | 774.6 |
| ගෙවීම් | 339.0 | 699.6 | 106.4 |
| **පෞද්ගලික ජංගම සංක්‍රාම, ශුද්ධ** | **1,828** | **2,169** | **18.6** |
| පෞද්ගලික සංක්‍රාම, ශුද්ධ | 1,735 | 2,068 | 19.2 |
| ලැබීම් | 1,968 | 2,326 | 18.2 |
| ගෙවීම් | 233 | 257 | 10.5 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-654** | **-1,334** | **104.1** |
| **ප්‍රාග්ධන ගිණුම** | **250** | **291** | **289.0** |
| **මූල්‍ය ගිණුම** | **974** | **1,517** | **55.7** |
| සෘජු ආයෝජන, ශුද්ධ | 234 | 451 | 93.0 |
| ලැබීම් | 272 | 480 | 76.5 |
| ගෙවීම් | 38 | 29 | -23.5 |
| පෞද්ගලික දිගුකාලීන, ශුද්ධ | 11 | -35 | -418.2 |
| ලැබීම් | 199 | 139 | -30.2 |
| ගෙවීම් | 188 | 174 | -7.5 |
| රාජ්‍ය දිගුකාලීන, ශුද්ධ | 553 | 491 | -11.3 |
| ලැබීම් | 747 | 932 | 24.7 |
| සුනාමි සම්බන්ධ ලැබීම් | 93 | - | |
| ගෙවීම් | 194 | 441 | 127.9 |
| කෙටිකාලීන | 176 | 610 | 246.8 |
| එයින් : විවිධ ආයෝජන ශුද්ධ | 60 | 51 | -15.6 |
| වැරදීම් සහ අත්හැරීම් | -69 | -270 | |
| **සමස්ත ශේෂය** | **501** | **204** | |
| දළ නිළ වත්කම් | 2,458.1 | 2,524.7 | |
| ආනයන මාස ගණන | 3.3 | 3.0 | |
| මුළු විදේශ වත්කම් | 3,923.6 | 3,572.5 | |
| ආනයන මාස ගණන | 5.3 | 4.2 | |
| ණය ආපසු ගෙවීමේ දී ලැබූ සහන | 264.0 | - | |
| අපනයන මිල දර්ශකය | 98.9 | 103.1 | 4.2 |
| ආනයන මිල දර්ශකය | 98.9 | 106.9 | 8.0 |
| වෙළෙඳ අනුපාතය | 100.0 | 96.5 | -3.5 |
| **විනිමය අනුපාත (සාමාන්‍ය)** | | | අධිප්‍රමාණය (+), අවප්‍රමාණය(-) |
| රුපියල්/එ.ජ. ඩොලර් | 100.50 | 103.96 | -3.3 |
| රුපියල්/යෙන් | 0.91 | 0.89 | 1.8 |
| රුපියල්/යුරෝ | 125.10 | 130.63 | -4.2 |
| රුපියල්/එ.රා.පවුම් | 182.87 | 191.53 | -4.5 |


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 0.4 කින් පහත වැටීම ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය (සංක්‍රාම හැර) තුළින් පැහැදිලි වන පරිදි, දේශීය ඉතිරි කිරීම්-ආයෝජන පරතරය පුළුල් වීමට බලපාන ලදී. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලෙස ලැබෙන අනේවාසික ශ්‍රී ලාංකිකයින්ගේ ඉතිරි කිරීම්, මෙම පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.3 දක්වා අඩු කිරීමට උපකාරී විය. ඉතිරි පරතරය සෘජු විදේශ ආයෝජන, රජය ලද ණය සහ ආධාර සහ විවිධ ආයෝජන තුළින් ලද ලැබීම්වලින් මූල්‍යනය කරන ලදී. ප්‍රාග්ධන නිමැවුම් වෘද්ධි අනුපාතය[1] 1990 ගණන්වල පැවැති සියයට 5 ක් පමණ වූ මට්ටමක සිට මෑත වර්ෂවලදී සියයට 4 ක් පමණ දක්වා අඩුවී ඇති අතර, ඒ අනුව පැහැදිලිවන්නේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය එක් ප්‍රතිශතයකින් ඉහළ නැංවීම සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ආයෝජන සාමාන්‍යයෙන් සියයට 4 ක් වත් විය යුතු බවයි. එයින් ගම්‍ය වන්නේ ප්‍රාග්ධන - නිමැවුම් වෘද්ධි අනුපාතය, දැනට පවතින මට්ටමේම පවතින්නේ නම්, සියයට 8-10 ක අතර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අවම වශයෙන් සියයට 32 - 40 ක පමණ ආයෝජන මට්ටමක් පැවතිය යුතු බවයි. මෑත කාලීනව ප්‍රාග්ධන නිමැවුම් වෘද්ධි අනුපාතය වර්ධනය වීමෙන් පැහැදිලි වන්නේ ආර්ථික වර්ධනය ඇති කිරීමෙහිලා පෞද්ගලික අංශයේ ආයෝජන වඩාත් ඵලදායී බවයි. පෞද්ගලික ආයෝජන මෙන්ම වඩාත් ඵලදායී රාජ්‍ය ආයෝජන වැඩි කිරීම සඳහා උනන්දු කරවීම තුළින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට හැකිවන පරිදි අනුගත ප්‍රාග්ධන නිමැවුම් වෘද්ධි අනුපාතය තවදුරටත් ඉහළ නැංවිය හැකිය. දැනට පවතින දේශීය ඉතිරි කිරීම් මට්ටම හා කෙටිකාලීනව ඉතිරි කිරීම් වර්ධනය කිරීමේ සීමාවන් සලකා බලන විට, රටට අවශ්‍ය ඉහළ ආයෝජන හා වර්ධන මට්ටමක් ළඟා කර ගැනීමට නම් විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම වඩාත් වැදගත් උපාය මාර්ගයක් වේ.


**ශක්තිමත් තිරසාර ගෝලීය ආර්ථික වර්ධනය සහ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් තුළින් වෙළෙඳපොළට ප්‍රවිෂ්ට වීමේ ඉඩ ප්‍රස්ථා ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය අංශය තවදුරටත් පුළුල් විය.** ශ්‍රී ලංකාව විසින් අපනයන යොමුකරනු ලබන ප්‍රධාන රටවල ඉහළ වර්ධනය, ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් හරහා තෝරාගත් වෙළෙඳපොළවල් කිහිපයකට ප්‍රවේශවීමට ඇති අවස්ථා ඉහළ යාම සහ නව හා ඉහළ අගයක් සහිත කුඩා වෙළෙඳපොළවලට සිය නිෂ්පාදිත සැපයීම සඳහා අපනයනකරුවන් අඛණ්ඩව උත්සාහ දැරීම හේතුවෙන් අපනයන තවදුරටත් වර්ධනය විය. ඒ අතරම, රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන ඉහළයාම හා ඛනිජ තෙල් මිල ගණන් වැඩිවීම හේතුවෙන් ආනයන ද ඊට වඩා වැඩි වේගයකින් වර්ධනය විය. වසර තුළ දී

[1]පෙර වර්ෂයෙහි ආයෝජන ද.දේ.නි. යෙහි අනුපාතය සහ පවත්නා වර්ෂයෙහි ආර්ථික වර්ධනය අතර අනුපාතයයි .

**1.3 රූප සටහන** **බනිජ තෙල් ආනයන වටිනාකම සහ ආනයනය කරන ලද බොරතෙල්වල සාමාන්‍ය මිල**




**1.4 රූප සටහන** **ගෙවුම් තුලනය**





බනිජ තෙල් මිල ගණන් අසාමාන්‍ය ලෙස ඉහළ මට්ටමක පැවතීම වෙළෙඳ අනුපාතය සියයට 3.5 කින් පිරිහීමට හේතුවිය. වෙළෙඳ හිඟයෙන් වැඩි ප්‍රමාණයක් මූල්‍යනය කිරීමට ඉහළ වර්ධනයක් පැවැති විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ උපකාරී විය. ජංගම ගිණුමේ තවදුරටත් පැවති හිඟය සෘජු විදේශ ආයෝජන සහ රජය ලද විදේශ ලැබීම් තුළින් මූල්‍යනය කරන ලද අතර, එමගින් අවසාන වශයෙන් සමස්ත ගෙවුම් තුලන අතිරික්තයක් ජනිත කරන ලදී. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, නිල විදේශ සංචිත වැඩි වූ අතර, එමගින් බාහිර කම්පනවලට ඔරොත්තු දීමට රටට ඇති හැකියාව ශක්තිමත් කෙරිණ. විනිමය අනුපාතිකය ආර්ථික මූලිකාංග අනුව හැසිරීමට අවශ්‍ය ඉඩකඩ සලසමින්, තවදුරටත් පාවෙන විනිමය අනුපාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ අතර, එය ආර්ථිකය මත බාහිර කම්පන මගින් ඇති කෙරෙන අයහපත් බලපෑම් අවම කිරීම උදෙසා ආයක විය.


**දිළිඳු ජනතාවට හිතකර වර්ධනාභිමුඛ සංවර්ධනයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසමින්, දිගුකාලීන තිරසාර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවක් ලබා ගැනීම වෙත යොමු වූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය 2006 දීත් නොකඩවා ක්‍රියාත්මක විය.** රජයේ ඉදිරි දැක්ම දැක්වෙන රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ට අනුකූල වන පරිදි රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් සකස් කර ඇති අතර, එය සමස්ත සාර්ව ආර්ථික ක්‍රමෝපායයන්ට අනුකූල වන සේ මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවක් තුළ සකස් කර ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අරමුණු ළඟාකර ගැනීමට සිදුවූයේ ඉහළ ජාත්‍යන්තර බනිජ තෙල් මිල ගණන්, ජාතික ආරක්ෂාව තර කිරීමේ අවශ්‍යතාව, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවති උද්ධමන පීඩනය සහ ඉහළ මට්ටමක පැවති පොලී අනුපාතික වැනි අභියෝග මධ්‍යයේය. මෙවැනි අභියෝග තිබියදීත්, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතුවල යම්කිසි වර්ධනයක් දක්නට ලැබුණි. ඒ සමගම, පුනරාවර්තන වියදම් අපේක්ෂිත මට්ටම ඉක්මවා යෑම, රාජ්‍ය ආයෝජන අපේක්ෂිත මට්ටමට වඩා අඩුවෙන් සිදුවීම හා අයවැය හිඟය මූල්‍යනය සඳහා බැංකු ණය යොදාගැනීම වැනි කරුණු අවධානයට ලක්විය යුතුව ඇත.

**රාජ්‍ය ආදායම හා ද.දේ.නි. අතර අනුපාතය වර්ධනය වීමේ උපනතිය අඛණ්ඩව පවත්වා ගැනීමේ රජයේ දැඩි උත්සාහය තුන්වන වසරටත් සාර්ථක විය.** පසුගිය වසරේ ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.1 ක් වූ මුළු ආදායම 2006 දී සියයට 17 දක්වා වැඩිවිය. විශේෂයෙන්, බදු ප්‍රතිපත්තිය, බදු පරිපාලනය සහ අදාළ නීති නිසි කලට ක්‍රියාත්මක කිරීම ආදියට ප්‍රතිචාර දක්වමින්, බදු ආදායම වැඩිවීමේ උපනතිය නොකඩවා තුන්වන වසරටත් පවත්වා ගනිමින් එය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් 2005 වසරේ දී සියයට 14.2 සිට 2006 දී සියයට 15.3 දක්වා වැඩිවිය. රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6.3 ක් ලෙස ඉහළ මට්ටමක පැවතුණි. ආර්ථික හා සමාජ යටිතල පහසුකම් නඟාසිටුවීම කෙරෙහි රාජ්‍ය ආයෝජන වැඩසටහනේ වැඩි ප්‍රමුඛතාවක් දැක්වීම අඛණ්ඩව සිදුවිය. කෙසේ වුවත්, ජාතික ආරක්ෂාව, මානුෂික සහන සැලසීම, වැටුප් සහ වේතන, විශ්‍රාම වැටුප් ඉන්ධන සහ පොහොර සහනාධාර යනාදිය සඳහා වියදම අයවැයෙන් වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අධිකවීම හේතුවෙන් රජයේ පුනරාවර්තන වියදම් ඉලක්ක අභිබවා ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ද.දේ.නි. ට පුනරාවර්තන වියදම් අනුපාතය පසුගිය වසරේ සියයට 18.7 සිට 2006 දී සියයට 19.5 දක්වා වැඩි විය. ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය 2005 දී සියයට 8.7 සිට 2006 දී සියයට 8.4 දක්වා අඩුවිය. විශේෂයෙන් වසරේ දෙවැනි භාගයේ දී දේශීය පොලී අනුපාතික වැඩිවීම සහ උද්ධමන අපේක්ෂාවෙන් ඉහළයාම නිසා අයවැය හිඟය මූල්‍යනය කිරීම අභියෝග යක් විය. රජය, විදේශ ව්‍යවහාර මුදල්වලින් යුත් දේශීය ණය මූල්‍යනය කරා වැඩි වශයෙන් යොමුවීම තුළින් දේශීය පොලී අනුපාතික වැඩිවීමේ බලපෑම තරමක් දුරට සමනය කරගත්තා ලදී. මේ සමගම රාජ්‍ය බැංකු සමග පැවති බැංකු අයිරා ශේෂ වැඩිවීම නිසා රජය බැංකු ක්‍රමය තුළින් ලබාගත් ණය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යාම මුදල් ප්‍රතිපත්ති කළමනාකරණය දුෂ්කර බවට පත්කරවීමට හේතු විය. දේශීය මූලයන්ගෙන් ණය පියවීම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.8 ක්

**1.5 රූප සටහන** රාජ්‍ය ආදායම, වියදම සහ අයවැය හිඟය




**1.6 රූප සටහන** රාජ්‍ය ණය




වූ අතර, දළ.දේ.නි. යෙන් සියයට 2.6 ක් වූ ඉතිරි ශේෂය විදේශ මූලයන්ගෙන් පියවනු ලැබීය.


**දළ.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2005 වසරේ සියයට 93.9 ක් වූ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2006 වසරේ සියයට 93.0 ක් දක්වා තුන්වෙනි වසරටත් නොකඩවා පහත වැටුණි.** නාමික දළ.දේ.නි. යේ ඉහළ වර්ධනය, නොපියවූ ණය තොගයේ නාමික වර්ධනය ඉක්මවා යාම මෙම වර්ධනයට හේතු විය. කෙසේ වුවද, මුළු රාජ්‍ය ණයවල නාමික වටිනාකම රුපියල් බිලියන 2,606 දක්වා රුපියල් බිලියන 384 කින් වැඩිවිය. විදේශීය ආධාර සපයන රටවල් විසින් ලබාදී තිබූ ණය ආපසු ගෙවීමේ සහන කාලය අවසන්වීමත් සමග ණය සේවා ගෙවීම් දර්ශක ඒවායේ සුනාමි ව්‍යසනයට පෙර තිබූ තත්ත්වයට නැවත පත්විය. කෙසේ වුවද, ණය සේවා ගෙවීම් දර්ශක රාශියකම සුනාමි ව්‍යසනයට පෙර ඒවායේ තත්ත්වය හා සසඳන විට වර්ධනයක් පැවතුණි.

**2006 දී යම් වර්ධනයන් වාර්තා වුවද, රාජ්‍ය මූල්‍ය අංශයෙහි ප්‍රධාන පසුබෑම් කිහිපයක් තවදුරටත් පවතී.** පුනරාවර්තන වියදම සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම, රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ප්‍රගතිය අඩුවීම, බැංකු පද්ධතියෙන් ලබාගත් ණය ඉහළ මට්ටමක පැවතීම සහ සාපේක්ෂ වශයෙන් රජයේ ණය බර අධික වීම මේ අතර ප්‍රධාන වේ. මෙම පසුබෑම් අතරින් ඉහළ මට්ටමක පවතින හා වර්ධනය වෙමින් පවතින පුනරාවර්තන වියදම් පිළිබඳව විශේෂ අවධානයක් යොමුවිය යුතුය. පුනරාවර්තන වියදම් අධික ලෙස ඉහළ යාමට සාමාන්‍යයෙන් හේතුවන්නේ වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප් ගෙවීම් හා කුටුම්භ, රාජ්‍ය සංස්ථා හා ආයතනවලට කරනු ලබන ප්‍රේෂණයන් සම්බන්ධ වියදම් අඛණ්ඩව ඉහළ යාමයි. මෙම අයිතමයන් තුන සඳහා වන වියදම් වෙනුවෙන් සමස්ත ආදායමෙන් සියයට 67 ක් පමණ අවශෝෂණය කරගන්නා අතර, එමගින් ආදායමෙහි ධනාත්මක වර්ධනයන්ගේ ප්‍රතිලාභ ඒ සඳහා යෙදවීමට සිදුවන බැවින් රාජ්‍ය මූල්‍ය කටයුතු හැසිරවීම දුෂ්කර වේ. එමෙන්ම, ඉහළ පුනරාවර්තන වියදම් නිසා රටේ අනාගත සංවර්ධනය සඳහා හේතුවන රාජ්‍ය ආයෝජන වෙනුවෙන් රජයේ ආදායමෙන් යොදවන ප්‍රමාණය අවශ්‍ය මට්ටමට වඩා අඩු මට්ටමක පවතී. 2006 අයවැය ගත වියදමට වඩා පුනරාවර්තන වියදමෙහි වූ වැඩිවීම රුපියල් බිලියන 38 ක් (දළ.දේ.නි.යෙන් සියයට 1.4) විය. මෙම ප්‍රමාණය රාජ්‍ය ආයෝජන සඳහා යෙදවිය හැකිව තිබුණා නම් අනාගතයේ ආර්ථික වර්ධනය ප්‍රතිශතාංක කිහිපයකින් ඉහළ නැංවීමට එමගින් දායකත්වයක් සැපයිය හැකිව තිබුණි.


**2006 - 2009 මැදිකාලීන අයවැය රාමුව සහ 2006 - 2016 දස අවුරුදු දැක්ම යන දෙකෙහිම අවධානය යොමු කර ඇති පරිදි, මෙම දුර්වලතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට රජයේ දැඩි කැපවීම වැදගත්ය.** සැලසුම් කළ පරිදි සුදුසු ක්‍රියා මාර්ග නිසි කලට ක්‍රියාත්මක කිරීම ඉතා අවශ්‍ය වන්නේ යම් ප්‍රමාදයන් සිදුවීම තුළින් අමතර සම්පත් යෙදවීමට අවශ්‍ය වීමත්, පෞද්ගලික ආයෝජන අඩුවීමට එයින් බලපෑමක් ඇතිවීමත්, උද්ධමන පීඩනය වැඩිවීමත් සිදුවිය හැකි බැවිනි. එය දිළිඳු බව සහ ප්‍රාදේශීය ආර්ථික විෂමතා තිරසාර ලෙස අඩුකිරීම සඳහා අවශ්‍ය අපේක්ෂිත ඉහළ ආර්ථික සංවර්ධන මාවත ළඟාකර ගැනීම අවදානම්කාරී තත්ත්වයකට පත්කරයි.

**2006 දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් ඉලක්ක කෙරුණේ ආර්ථිකයේ අඛණ්ඩව පවතින වර්ධනීය තත්ත්වයට උපකාරීවන අතර, ඉහළ යන ඉල්ලුමෙන් ජනිත වන උද්ධමනාත්මක පීඩනයන්ගේ තර්ජනය අඩුවන පරිදි ඉහළ මුදල් සහ ණය ප්‍රසාරණය පාලනය කිරීමයි.** ඒ අනුව, දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, විවට වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකරමින් අතිරික්ත ද්‍රවශීලතාව දෛනිකව මෙන්ම නිත්‍ය පදනමක් මත අවශෝෂණය කර ගැනීම තුළින් වෙළෙඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව ඉහළයාම අවම කෙරිණි. මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික, 2004 හා 2005 දී සිදුකෙරුණු පදනම් අංක 175 ක ඉහළ නැංවීමට අමතරව, 2006 වසරේ දෙවන භාගයේ දී පදනම් අංක 125 කින් ඉහළ නැංවිණි. මෙම ක්‍රියාමාර්ගයන්ට අමතරව, ඇතැම් තෝරාගත් ආනයනික

**1.7 රූප සටහන** **සංචිත මුදල් සහ පුළුල් මුදල් වර්ධනය**




**1.8 රූප සටහන** **පොලී අනුපාතිකයන්හි වෙනස්වීම්**




භාණ්ඩ සඳහා ණයවර ලිපි ආන්තික අවශ්‍යතාවන් පනවන ලද අතර, එම ආන්තික අවශ්‍යතාවන් පවත්වා ගැනීම වෙනුවෙන් බැංකු විසින් ණය ලබා දීම අත්හිටුවන ලෙස ද බැංකුවලට උපදෙස් සපයන ලදී. ඉහළ ණය ප්‍රසාරණය අඩු කිරීමේ තවත් පියවරක් ලෙස වාණිජ බැංකු විසින් ප්‍රතිවිකුණුම් පහසුකම යටතේ මහ බැංකුවෙන් ණය ලබා ගැනීම අධෛර්යමත් කිරීම සඳහා ශිෂ්ට ප්‍රයෝග ද භාවිතා කෙරිණි. මෙම උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සියලු සක්‍රිය ණය මත පොදු ප්‍රතිපාදන අවශ්‍යතාවක් පැනවීම හා ප්‍රාග්ධන අවශ්‍යතා ගණනයේ දී ණය සඳහා අදාළ වන අවදානම් බර තැබීම් ඉහළ දැමීම වැනි විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ගැනීම ද සිදුවිය. රජය බනිජ තෙල් සහනාධාරය ඉවත් කිරීම ද මේ සඳහා උපකාරී වනු ඇති අතර, එයට හේතුව සහනාධාර අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින් රජයේ අයවැය මූල්‍යනය කෙරෙහි පීඩනයක් ඇතිවී එය මුදල් සැපයුමේ ප්‍රසාරණයකට හේතුවන බැවිනි.

මුදල් ප්‍රසාරණය යම්තාක් දුරකට අඩුකර ගැනීම සඳහා මෙම ක්‍රියාමාර්ග උපකාරී විය. කෙසේ වුවද, වසර අවසානය වන විට බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශය ලබාගත් ණය විශාල ලෙස ඉහළයාම මුදල් ඉලක්ක සපුරා ගැනීම සඳහා අභියෝගයක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සංචිත මුදල් මෙන්ම පුළුල් මුදල්වල ද වර්ධනය අඩුවීමේ උපනතිය වසරේ අවසාන කාර්තුව තුළ දී ආපසු හැරවිණි. 2006 මාර්තු දක්වා අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ උද්ධමනය, ඉහළ මුදල් ප්‍රසාරණයේ ප්‍රතිඵල පිළිබිඹු කරමින්, අනතුරුව ඉහළයාම ඇරඹිණි. ජීවන වියදම මත එක්වරක් මිළ ඉහළයාමේ බලපෑමකට හේතුවන පාලන මිලගණන් ඉහළයාම මගින් මෙය තවදුරටත් උග්‍ර කෙරිණි. කෙසේ වුවද, මෙම මිල ගැළපීම් නිසා මුදල් සැපයුම ප්‍රසාරණය කරමින් අදාළ නිෂ්පාදන සඳහා සහනාධාර දීමේ අවශ්‍යතාව දුරු කරන අතර, එමගින් දිගුකාලීනව උද්ධමනය පාලනය කිරීම කෙරෙහි හිතකර බලපෑමක් ඇති කෙරෙනු ඇත. 2007 සඳහා මුදල් ඉලක්ක සකස් කිරීමේ දී, 2006 දී සිදු වූ මුදල් සමස්තයන්හි පැවති ඉහළ වර්ධනය සැලකිල්ලට ගත් අතර, මහ බැංකුව 2007 සඳහා සිය මුදල් ප්‍රතිපත්ති සැලසුම සකස් කර එය 2007 ජනවාරි මස දී "2007 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" මගින් නිවේදනය කරන ලදී. අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සහතික කරනු වස් මුදල් ඉලක්ක සැකසීමට අමතරව අනෙකුත් ක්‍රියාමාර්ග රැසක්ම ගනු ලැබීය.

මූල්‍ය යටිතල පහසුකම් වර්ධනය, ප්‍රධාන මූල්‍ය ආයතන මත නියාමන හා අධීක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම සහ අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සමග මූල්‍ය පද්ධති ස්ථායීතාව 2006 දී තවදුරටත් ශක්තිමත් විය. සිල්ලර හා අඩු අගයකින් යුතු ගෙවීම් පිරිසැකසීම සඳහා ඡායාගත චෙක්පත් පිළිබිඹු ක්‍රමය 2006 දී හඳුන්වාදුන් අතර, එමගින් නිශ්කාෂණ ක්‍රියාදාමයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු වනු ඇත. ජාතික ගෙවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් නවීකරණය ඉදිරියට ගෙනයාම ද සඳහා පහසුකම් සලසනු පිණිස සියලු ප්‍රධාන හවුල්කරුවන්ගේ නියෝජනයෙන් ජාතික ගෙවීම් සභාවක් (National Payment Council) ස්ථාපනය කෙරිණි. ගෙවීම් උපාංග හා සම්බන්ධ නීති විරෝධී හා අන්තරායකාරී පරිචයන් මැඩලීම සඳහා නීති හඳුන්වාදීම මගින් ගෙවීම් හා පියවීම් පද්ධතිය තවදුරටත් සවිමත් කෙරිණි. බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ණය මෙහෙයුම් කටයුතුවලට අදාළව මුදල් මණ්ඩලය සතු බලතල සවිමත් කිරීමට මුදල් නීති පනත සංශෝධනය කෙරිණි. 2006 දී මහ බැංකුව විසින් විශේෂිත කල්බදු සමාගම් නියාමනය හා අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදී. ප්‍රාග්ධන වෙන්කිරීම් සමාන්තරව ගණනය කිරීම සඳහා බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින් බාසල් II ප්‍රාග්ධන අවශ්‍යතා රාමුව ක්‍රියාත්මක කිරීමට සූදානම්වීම සඳහා ඉඩ සැලසුනි. බාසල් ප්‍රාග්ධන සම්මුතිය අනුව, වෙළෙඳපොළ අවදානම සඳහා ප්‍රාග්ධන වෙන්කිරීමක් 2006 දී හඳුන්වා දෙනු ලැබීය. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් සැපයීම මගින් ඇතිවන අවදානම් හඳුනාගනිමින් මූල්‍ය පද්ධතියෙහි ඒකාබද්ධතාව සහ ඒ කෙරෙහි ඇති විශ්වාසය වර්ධනය වන පරිදි, මෙම

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති 1

**විශේෂ සටහන 2**

## බැංකු පිළිබඳ මහජන විශ්වාසය ශක්තිමත් කිරීම

### මහජන විශ්වාසයෙහි ඇති වැදගත්කම

බැංකු ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ බැංකු පිළිබඳව ඇති මහජන විශ්වාසය මත වේ. බැංකුවල මූලික ව්‍යාපාර කටයුත්ත වන්නේ, මුදල් ඉතුරුම් සහ තැන්පත්කරුවන්ගෙන් මුදල් භාරගැනීම හා එම මුදල් ආයෝජනය කරන්නන්ට හෝ වෙනත් අරමුණු සඳහා අවශ්‍ය අයට ණයට දීම මගින් කරනු ලබන මූල්‍ය අතරමැදිකරණයයි. මහජනතාව බැංකුවල මුදල් තැන්පත් කරනු ලබන්නේ අවශ්‍ය විටෙක එම මුදල් බැංකු විසින් නැවත ගෙවන බවට ඇති විශ්වාසය මතයි. බොහෝ තැන්පත්කරුවන් විසින් ඔවුන්ගේ ඉතුරුම් ආරක්ෂිත ලෙස තබාගන්නා භාරකාර ආයතන ලෙස බැංකු සලකනු ලැබේ. එම නිසා තැන්පතු සහ මූල්‍ය පහසුකම් සැපයීම තුළින් ලාභ ඉපැයීමේ වරප්‍රසාදය බැංකුවලට ලැබී ඇත. දුර්වල අවදානම් කළමනාකරණය හේතුවෙන් මූල්‍ය වගකීම් ඉටුකිරීමට බැංකුවක් අසමර්ථවීම නිසා මෙන්ම සමස්ත බැංකු ක්‍රමය පුරා බැංකු පරිහානියක් පැතිරීම සහ ආර්ථික අර්බුද හේතුකොටගෙන ද බැංකු පිළිබඳ මහජන විශ්වාසය බිඳවැටීම හෝ එයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බව මේ පිළිබඳ අත්දැකීම් වලින් පෙන්නුම් කරයි. එම නිසා, බැංකුවල සුරක්ෂිත භාවය හා මූල්‍ය ශක්තිමත් භාවය මහජන විශ්වාසයේ පදනම වේ.

එබැවින්, සුරක්ෂිත සහ ශක්තිමත් බැංකු ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ලෝකයේ විවිධ රටවල බැංකු අධිකාරීන් විසින් බැංකු ක්‍රමයට නව බැංකු ඇතුළත්වීමේ සහ අධීක්ෂණය කිරීමේ කටයුතු නියාමනය සහ සුපරීක්ෂණය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබේ. බැංකු ක්‍රමය තුළට ඇතුළත්වීම නියාමනයේදී, බැංකු ආරම්භ කිරීම සහ බැංකු වසාදැමීම පිළිබඳ නීතිරීති ඇතුළත් වේ. මෙයට අවම ප්‍රාග්ධනය සහ බැංකු වලට බලපත්‍ර ලබාදීම සම්බන්ධ නීති මූලික වශයෙන් අයත් වෙයි. එදිනෙදා බැංකු ව්‍යාපාරික කටයුතු සම්බන්ධ විධිවිධාන අතර අවම ප්‍රාග්ධන අනුපාතයන්, අවම ද්‍රවශීලතා අනුපාතයන්, බොල්ණය සඳහා වෙන්කිරීම්, කේවල ණය ගැති සීමා, බැංකු අයිතිය පිළිබඳ සීමා, සමීප අධීක්ෂණය සහ ගැටළු නිරාකරණය ආදී බැංකුවල අවදානම් කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් විවිධ විචක්ෂණ අවශ්‍යතා ඇතුළත් වේ. මෙයට අමතරව, බැංකු නිලධාරීන් විසින් බැංකු පරිහානියක් පැතිරීමේ අවදානම් වළකාලීම පිණිස මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය අධීක්ෂණය කිරීම ද සිදුකරනු ලැබේ.

### මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග

බැංකු පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමට සහ ශක්තිමත් කිරීමට මහ බැංකුව විසින් බාසල් සම්මතයන් ඇතුළු අන්තර් ජාතික පිළිගැනීම් සහිත සම්මත නියාමන ක්‍රම රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව, ප්‍රාග්ධන හිඟයන් සහ ද්‍රවශීලතා ඌනතාවයන් ආදී විශේෂ ගැටළු නිරාකරණයට සම්බන්ධ විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. 1990 මුල් කාලපරිච්ඡේදයේ සිට රජය විසින් කිහිපවාරයක් රාජ්‍ය බැංකුවලට ප්‍රාග්ධනය ලබාදීම තුලින් රාජ්‍ය බැංකු පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැංවීමට කටයුතු කර ඇත. පොදුවේ මූල්‍ය ක්‍රමයට බලපෑමක් කිරීමට හෝ මහජන විශ්වාසයට යම් හානියක් සිදුකිරීමට තරම් වැදගත්කමක් නොපැවතුනද, 2002 ඔක්තෝබර් මස ප්‍රමුඛ සේවින්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් බැන්ක් හි අසාර්ථක වීම හේතුවෙන් කුඩා බැංකුවල ශක්‍යතාවය සහ ශක්තිමත්භාවය පිළිබඳව යම්තාක් දුරකට මහජනයාගේ අවධානය යොමු විය. අසාර්ථක වූ ප්‍රමුඛ බැංකුවේ ව්‍යාපාර කටයුතු පැවරීම සඳහා නව රාජ්‍ය බැංකුවක් වන ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් පිහිටුවීම සඳහා 2006 සහ 2007 දී ක්‍රියාවට නැංවූ රජයේ ප්‍රතිපත්ති තීරණය, කුඩා බැංකු පිළිබඳ මහජන විශ්වාසය නැවත ගොඩනැංවීමට ගත් ප්‍රධාන පියවරක් විය. මෙයට අමතරව, මහ බැංකුව විසින් බැංකු පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය කිරීමට සහ පොදුවේ මූල්‍ය ක්‍රමයට ඇතිවියහැකි අවදානම් අවම කිරීමට විවිධ අධීක්ෂණ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒවා අතර මූල්‍ය වශයෙන් ස්ථායී බැංකු දෙකක උපකාරය මත 2003 දී කුඩා බැංකු දෙකක් ප්‍රතිව්‍යුහගත කිරීම සහ 2005 අප්‍රේල් මසදී බැංකු වල තිබිය යුතු අවම ප්‍රාග්ධන ප්‍රමාණය වැඩිකිරීම ප්‍රධාන පියවරයන් විය. බැංකුවල ඒකාබද්ධතාවය වැඩිකිරීමට මෙම ක්‍රියාමාර්ගය ඉවහල් විය.

එසේම, පෞද්ගලික බැංකු කිහිපයක ඉහළ මට්ටමේ හිමිකාරත්වය සම්බන්ධ ගැටලු ද, තැන්පත් හිමියන් සහ මූල්‍ය අංශයට සම්බන්ධ පාර්ශවයන් අතර බියක් ඇතිකිරීමට හේතු විය. 2007 ජනවාරි මසදී බැංකුවල හිමිකාරත්වය නියාමනය කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීමෙන් මෙවැනි බිය තුරන් කිරීමට මහ බැංකුව සමත් විය. ඒ අනුව, තනි කොටස්කරුවන් හෝ සමූහයක් විසින් බැංකුවල අත්කරගෙන ඇති විශාල හිමිකාරත්වය අවුරුදු 5 ක් වූ උපරිම කාලච්ඡේදයක් තුළ සියයට 15 කට අඩු කිරීමට නියම කෙරිණි. මෙය බැංකුවල හිමිකාරත්වය වඩාත් ව්‍යාප්ත කොට අධ්‍යක්ෂ මණ්ඩලවල අභිලාශයන් අතර ගැටුම් වැළැක්වීම උදෙසා ගත් ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යක් විය. 2006 අවසාන භාගයේ සිට පරිභෝජන කටයුතු සඳහා දෙන ලද ණය වල අධික වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, පරිභෝජන ණයවල අධික ප්‍රසාරණය වැළැක්වීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තියට බැංකු නියාමන ක්‍රියාමාර්ගයන්ගේ උපකාරය අවශ්‍ය විය. විශාල අනුපාතයකින් සිදුවන ණය ප්‍රසාරණය හේතුවෙන් ණයවල ගුණාත්මකභාවය අඩුවීමට ඇති හැකියාව නියාමනයේ අවධානය යොමුවූ කරුණකි. මෙම තත්ත්වයට මුහුණ දීම පිණිස, දැනට පවතින අක්‍රීය ණය සඳහා කරනු ලබන මුදල් වෙන්කිරීම්වලට අමතරව ක්‍රියාකාරී ණය සඳහා ද සියයට 1 ක මුදල් වෙන්කිරීමක් හඳුන්වා දෙන ලදී. එසේ වුවත් මෙම ක්‍රියාමාර්ගය මගින් බැංකුවල ලාභදායිතාවයට ඇතිවන අහිතකර බලපෑම සැලකිල්ලට ගෙන එක් කාර්තුවකට සියයට 0.1 ක මුදල් වෙන්කිරීමක් බැගින් 2006 සතර වන කාර්තුවේ සිට ආරම්භ වන පරිදි කාර්තු 10 ක කාල පරිච්ඡේදයක් තුළ මෙම වෙන්කිරීම් කරන ලෙසට නියම කෙරිණි. බැංකු මගින් ලබාදෙන මූල්‍ය පහසුකම්වල උපරිමය සඳහා වන විචක්ෂණ අවශ්‍යතාවය 2007 පෙබරවාරි මාසයේ දී සංශෝධනය කිරීම මගින් ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීමටත්, ණය ව්‍යාප්තිය පුළුල් කිරීමටත් බලාපොරොත්තු වේ.

එසේ ම බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතාවය හා ගනුදෙනුකරුවන්ගේ ණය ශ්‍රේණිගත අනුපාතය සැලකිල්ලට ගනිමින් බැංකුවල හා ගනුදෙනු කරුවන්ගේ අවදානම් කළමනාකරණය වර්ධනය කිරීමටත් අපේක්ෂා කෙරිණි.

තව දුරටත් ක්‍රියාත්මක කළයුතු ප්‍රධාන විචක්ෂණ ක්‍රියාමාර්ග අතර සාංගමික යහපාලනය සඳහා වූ අනිවාර්ය නීති මාලාව සහ බාසල් II සම්මුතිය ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. දැනට පවතින ස්වේච්ඡා සාංගමික යහපාලනය වෙනුවට අනිවාර්ය සාංගමික යහපාලනයක් ක්‍රියාවේ යෙදවීම මඟින් බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ක්‍රියාකාරීත්වය හා අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීමටත් ඒ වෙනුවෙන් වගකිව යුතු පාර්ශවයක් බවට පත්කිරීමටත් බැංකුවල තැන්පත් කරුවන්ට පාර්ශවකරුවන් වශයෙන් ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදීමටත් ඉඩ සලසයි. මධ්‍යකාලීනව ඉහළ ප්‍රවේශයකට යාමේ සැලසුම් සහිතව බාසල් II සම්මුතිය ප්‍රමිතිගත ප්‍රවේශයක් සහිතව 2008 දී හඳුන්වාදෙන ලද අතර, එමඟින් ණය අවදානම ආවරණය කිරීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගැනීම තුළින් බැංකුවල අවදානම කළමනාකරණය වර්ධනය කෙරේ.

බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන පිළිබඳ අධීක්ෂණය සහ නියාමනය සම්බන්ධීකරණය සඳහා මූල්‍ය නියාමන ආයතනවල ප්‍රධානීන්ගේ කමිටුව හා මූල්‍ය නියාමන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් ද පත්කරන ලදී. මෙම කමිටු දෙක තුළින් නියාමන ආයතන අතර නියාමන තොරතුරු හුවමාරු කිරීම ස්ථාපනය කළ හැකිය. බැංකුවල ගැටලු හඳුනාගෙන නීති ප්‍රකාරව සහ ශිෂ්ට ප්‍රයෝග තුළින් එම ගැටලුවලට පිළියම් යෙදීම සඳහා මහ බැංකුව කරනු ලබන අධීක්ෂණ ක්‍රියාමාර්ගයට අතිරේකව මෙම ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත.

**වෙළෙඳපොළ විනය වර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග**

පොදු ජනතාව තමන්ගේ තීරණවල ඇති අවදානම් දැරීමට සූදානම් වන ආකාරයට වෙළෙඳපොළ විනය වර්ධනය කිරීමකින් තොරව අධීක්ෂණ ක්‍රියාමාර්ග තුළින් ලබාදෙන ආරක්ෂණය හිතකර නොවේ. ඊට හේතුව, නියාමනය හේතුවෙන් ඇතිවන සදාචාරාත්මක ව්‍යසනයන් එනම් නියාමනය තුළින් ලැබෙන ආරක්ෂණය නිසා වැඩි අවදානම් දැරීම සඳහා මහජනතාව පෙළඹවීම අධික පිරිවැයක් සහිත වීමයි. බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමේදී ඇති අවදානම පිළිඳව, ජනමාධ්‍ය තුළින් සහ විවිධ ප්‍රකාශන නිකුත් කිරීම මගින් මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් මහ බැංකුව විසින් අඛණ්ඩව කරගෙන යනු ලබයි. එසේම සමස්ත මූල්‍ය ක්‍රමයේ ඇති අවදානම් පිළිබඳ විශ්ලේෂණයන් හා තොරතුරු ඇතුළත් වාර්ෂික මූල්‍ය ස්ථායිතා වාර්තා තුනක් ප්‍රකාශයට පත්කරන ලදී. ප්‍රධාන කාර්යසාධන දර්ශනයන් ඇතුළත් කොට තම මූල්‍ය වාර්තාව කාර්තු පදනමක් මත මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කළයුතු බවට බැංකුවලට නියමකොට ඇත. එසේම සෑම බැංකුවක්ම අනුමත ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් වෙතින් තම බැංකුව සඳහා ණය ශ්‍රේණිගත කිරීමක් ලබාගත යුතු අතර, තැන්පතු ලබාගැනීමේ අරමුණ ඇතිව පළ කරනු ලබන සෑම වෙළෙඳ දැන්වීමකම තම ණය ශ්‍රේණිය සඳහන් කළයුතුය. මෙම ක්‍රියාමාර්ග තුළින් සියළුම තැන්පත්කරුවන් හෝ ආයෝජකයින්, යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ඇති තමන්ගේ තැන්පතු හෝ ආයෝජන වල අවදානම සහ ප්‍රතිලාභ පිළිබඳව තමාට ඇති පැහැර හැරිය නොහැකි වගකීම අවබෝධ කරවීමට අපේක්ෂා කෙරේ. එසේම නියාමනය මගින් ආයෝජකයෙකුගේ හෝ තැන්පත්කරු-වෙකුගේ ආයෝජන හෝ තැන්පත් මුදල්වල සුරක්ෂිතභාවය සහතික කිරීමක් අදහස් නොවන බව සැළකිය යුතුය. මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය සඳහා බැංකු, මූල්‍ය ආයතන සහ ගනුදෙනුකරුවන් යන සෑම පාර්ශවයකම මනා අවදානම් කළමනාකරණය සහ වෙළෙඳපොළ විනය ප්‍රවර්ධනය කිරීමට නියාමනය මගින් උත්සාහ දරනු ලබයි.

නව තර්ජනයන් ඇතිවීම මැඩලීම සඳහා ශ්‍රී ලංකාව පරිපූර්ණ නීති හඳුන්වා දුන්නේය. අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවක්, සහ ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයක් ක්‍රියාත්මක කිරීම මගින් මූල්‍ය සමාගම්වලට අදාළ විචක්ෂණශීලී නියමයන් තවදුරටත් ශක්තිමත් කෙරිණි. ණය තොරතුරු කාර්යාංශයෙහි ආවරණපථය වැඩිදියුණු කිරීමටත් ක්‍රියාකාරිත්වය පුළුල් කිරීමට හා නවීකරණය කිරීමටත් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

ඉහළ ආර්ථික ක්‍රියාකාරීත්වයකට උපකාරී වෙමින් මූල්‍ය අංශය 2006 දී තවදුරටත් ප්‍රසාරණය විය. ලාභදායිතාවය, ප්‍රාග්ධන මට්ටම් හා වත්කම්වල ගුණාත්මකභාවය සහ පිරිනමනු ලැබූ නිෂ්පාදිත හා සේවා පරාසය යන අංශයන්ගෙන් මූල්‍ය අංශයේ ආයතනික ක්‍රියාකාරිත්වය, 2006 දී වැඩිදියුණු විය. ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශය හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්හි මූල්‍ය පහසුකම් සඳහා වන ප්‍රවේශ පුළුල් කිරීම පිණිස ආරම්භක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක් වසර තුළ දී ගැනුණි. විශේෂයෙන්, කොටස් හා විදේශ විනිමය වෙළෙඳපොළවල්හි ඉහළ ගනුදෙනු පරිමාවක් වාර්තා කරමින් මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වර්ධනය විය. දේශීය මූල්‍ය වෙළෙඳපොළෙහි තවදුරටත් ඇතිවූ වර්ධනයක් වූයේ භාණ්ඩාගාර බැඳුම්කර විදේශ ආයෝජකයන් සඳහා විවෘත කිරීමයි. මෙමගින් ආයෝජක පදනම පුළුල් වීමත් බැඳුම්කර වෙළෙඳපොළ තරගකාරිත්වය වර්ධනය කිරීමත් සිදුවනු ඇත.

## 1.2 විදේශීය ආර්ථික පරිසරය

කෙටිකාලීන පොලී අනුපාතික ඉහළ යෑම, ඛනිජ තෙල් ඇතුළු වෙළෙඳ භාණ්ඩ මිල ඉහළ යෑම සහ මූල්‍ය වෙළෙඳපොළවල පැවති අධික උච්චාවචනයන් මධ්‍යයේ වුව ද, ලෝක ආර්ථිකය 2006 වසරේ දී නොකඩවා 4 වැනි වසරටත් ශක්තිමත් වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය. එක්සත් ජනපද ආර්ථික වර්ධනය මන්දගාමී වීම සහ විශේෂයෙන් යුරෝපයේ සහ ජපානයේ ආර්ථික

**1.4 සංඛ්‍යා සටහන**

**ගෝලීය ආර්ථික ප්‍රවණතාවයන් සහ ඉදිරි දැක්ම**
(වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස)නිෂ්පාදිතය

| ශීර්ෂය | ප්‍රත්‍යක්ෂ අගයන් | | පුරෝකථන | |
|---|---|---|---|---|
| | 2004 | 2005 | 2006 | 2007 |
| **ලෝක නිෂ්පාදිතය** | **5.3** | **4.9** | **5.1** | **4.9** |
| සංවර්ධිත ආර්ථිකයන් | 3.2 | 2.6 | 3.1 | 2.7 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 3.9 | 3.2 | 3.4 | 2.9 |
| යුරෝ කලාපය | 2.1 | 1.3 | 2.4 | 2.0 |
| එක්සත් රාජධානිය | 3.3 | 1.9 | 2.7 | 2.7 |
| ජපානය | 2.3 | 2.6 | 2.7 | 2.1 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 7.7 | 7.4 | 7.3 | 7.2 |
| සංවර්ධනය වන ආසියාව | 8.8 | 9.0 | 8.7 | 8.6 |
| චීනය | 10.1 | 10.2 | 10.0 | 10.0 |
| ඉන්දියාව | 8.0 | 8.5 | 8.3 | 7.3 |
| **ලෝක වෙළෙඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **10.6** | **7.4** | **8.9** | **7.6** |
| ආනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 9.1 | 6.0 | 7.5 | 6.0 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 16.4 | 11.9 | 13.0 | 12.1 |
| අපනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 8.8 | 5.5 | 8.0 | 6.0 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 14.6 | 11.8 | 10.7 | 10.6 |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 2.0 | 2.3 | 2.6 | 2.3 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 5.6 | 5.3 | 5.2 | 5.0 |
| භාණ්ඩ මිල (එ.ජ. ඩොලර්) | | | | |
| ඉන්ධන | 30.7 | 41.3 | 29.7 | 9.1 |
| ඉන්ධන නොවන | 18.5 | 10.3 | 22.1 | -4.8 |
| එ.ජ. තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය | 1.8 | 3.8 | 5.4 | 5.5 |

මූලය : World Economic Outlook (2006 සැප්තැම්බර්) ජා.මූ.අ.

වේගවත්ව යථා තත්ත්වයට පත් වීමත් ඉන්දියාව හා චීනය ඇතුළු දියුණු වෙමින් පවතින රටවල ආර්ථික ශක්තිමත්ව පුළුල්වීමත් හේතුවෙන් තෙල් සහ වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඉහළයාම මධ්‍යයේ වුවද, මෙම ඉහළ වර්ධනය ළඟාකර ගැනීමට හැකි විය. ලෝක ආර්ථික දැක්ම (World Economic Outlook) 2006 සැප්තැම්බර් කලාපයට, අනුව ලෝක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2005 දී වාර්තා වූ සියයට 4.9 සිට 2006 වසරේ දී සියයට 5.1 දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම ඉහළ වර්ධනයට අනුව යමින්, වෙළෙඳ පරිමාව අනුව ලෝක වෙළෙඳාමේ වර්ධනය 2005 වසරේ දී වාර්තා වූ සියයට 7.4 ක සිට 2006 දී සියයට 8.9 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිත ය. 2006 වසරේ දී වූ මෙම ඉහළ වෙළෙඳ වර්ධනය ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට ද වාසිදායක විය. උද්ධමන පීඩන සීමා කිරීම සඳහා බොහොමයක් දියුණු සහ නැඟී එන ආර්ථිකයන් විසින් අනුගමනය කළ දැඩි පොලී අනුපාතික ප්‍රතිපත්ති හේතුවෙන් කෙටිකාලීන පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ ගියේ ය. ගෝලීය ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වීමත් සමඟ සංවර්ධිත සහ නැඟී එන ආර්ථිකයන්හි නිමැවුම් පරතරය (Output Gap) අඩුවීම නිසා ගෝලීය උද්ධමනය ඉහළ යාමේ ලක්ෂණ පෙන්නුම් කොට තිබේ. ඉහළ ඛනිජ තෙල් මිල ගණන් හේතුවෙන් බොහොමයක් සංවර්ධිත ආර්ථිකයන්හි මතුපිට උද්ධමනය (Headline Inflation) ඉහළ යමින් පවතී. එමෙන් ම එම රටවල මූලික උද්ධමනය (Core Inflation) ද ඉහළ ගොස් ඇත.

**2007 වසරේ දී අඛණ්ඩව පස්වන වරටත් ලෝක ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව රඳවා තබා ගැනීමට හැකිවනු ඇත.** බ්‍රෙට්න්වුඩ් ක්‍රමය බිඳ වැටීමෙන් පසුව වාර්තා වූ දීර්ඝතම හා තිරසාර වර්ධන කාලය බවට පත්වෙමින් ලෝක ආර්ථිකයේ සැලකිය යුතු පුළුල් වීමක් මෙමගින් පෙන්නුම් කෙරේ. අඛණ්ඩව මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සහ පෞද්ගලික පරිභෝජනය සහ නිවාසවල ආයෝජනය අඩු කරමින් නිවාස වෙළෙඳපොළ කටයුතුවල අඩු වර්ධනයක් පැවතීමට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළක් වන එක්සත් ජනපදයේ ආර්ථිකය 2007 වසර තුළ දී මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ නමුත්, එක්සත් ජනපද ආර්ථිකයේ මන්දගාමී වීමේ බලපෑම අනෙකුත් ආර්ථිකයන් කරා පැතිරීමේ හැකියාව අඩු මට්ටමක පවතී. යුරෝ කලාපීය ආර්ථික යථා තත්ත්වයට පත්වීමත් සමඟ එක්සත් ජනපද ආර්ථිකය මන්දගාමී බවට පත්වීමේ අයහපත් ප්‍රතිවිපාක සමනය වනු ඇත. නැඟී එන ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් ඉහළ අගයකින් වර්ධනය වනු ඇති අතර, ඉන්දියානු සහ චීන ආර්ථිකය ද ශක්තිමත් ලෙස අඛණ්ඩව පුළුල් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. පුරෝකථනය කරන ලද ඉහළ ගෝලීය ආර්ථික වර්ධනය තුළින් කුඩා විවෘත ආර්ථිකයක් වශයෙන් ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වුව ද, මෙම පුරෝකථනවලට යම් අවදානම් ද පවතින බව සැලකිල්ලට ගත යුතු ය. 2007 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් එක්සත් ජනපද ජංගම ගිණුමේ හිඟය සියයට 6.9 දක්වා තවදුරටත් පුළුල් වීමත් සමඟ ගෝලීය අසමතුලිතතාවන් වැඩි වීමට ඉඩ ඇත. එක්සත් ජනපද ඩොලරයේ යම් අක්‍රමවත් හැඩගැසීම් තුළින් තවදුරටත් අසමතුලිතතාවන් වැඩි විය හැකි අතර, එමගින් කළින් හඳුනාගත නොහැකි මූල්‍ය අර්බුද ඇතිවිය හැකි ය. ඒ අතරම, උද්ධමනාත්මක පීඩන මර්ධනය කිරීම සඳහා 2006 වර්ෂයේ දී බොහොමයක් රටවල් දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හේතුවෙන් 2007 වසරේ දී ආර්ථික වර්ධනය මන්දගාමී වීමට ඉඩ ඇත. ධාරිතා සීමාකම් සහිතව උපරිම ධාරිතාව ආසන්නයේ ම ක්‍රියාත්මක වන ආර්ථිකයන්ගෙන් සමන්විත ඇතැම් රටවල් තවදුරටත් ප්‍රසාරණය වුවහොත් අවශ්‍යයෙන් ම ඉහළ වැටුප් සඳහා ඉල්ලුමක් මෙන් ම පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනයක් ඇති කෙරෙනු ඇත. මැද පෙරදිග කලාපයේ භූ-දේශපාලනික සාධක විසින් ඇතිවිය හැකි බාධාවන් තුළින් ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑමට ද බලපෑමක් ඇතිවිය හැකි ය.

**උද්ධමනාත්මක පීඩන මැඩපැවැත්වීමට බොහෝ රටවල් කෙටි කාලීන පොලී අනුපාතික ඉහළ දමන ලදී.** කෙසේ වෙතත්, ගෝලීය අතිරික්ත ද්‍රවශීලතාව හේතුවෙන්

දිගුකාලීන පොලී අනුපාතික පහළ මට්ටමක පැවතුණි. යුරෝ කලාපය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, චීනය, ඉන්දියාව, කොරියාව, එකසත් ජනපදය, කැනඩාව, ජපානය, මැල්සියාව සහ මෙක්සිකෝව යන රටවල් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දමා ඇත. පොලී අනුපාතික ඇඩි කිරීම් හේතුවෙන් සහ නිවාස වෙළෙඳ කටයුතු මන්දගාමී වීම හේතුවෙන් ආර්ථික වර්ධනය මධ්‍යස්ථ වීම නිසා 2004 ජූනි මස සිට 2006 ජූනි මස දක්වා පියවර 17 ක දී පදනම් අංක 25 බැගින් ඉහළ දැමූ එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉන්පසු ඉහළ නැංවීම අත්හිටුවන ලදී. 2001 සැප්තැම්බර් මස සිට ශුන්‍ය මට්ටමේ පවත්වා ගන්නා ලද ජපානයේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 2006 ජූලි මාසයේ දී සියයට 0.25 කින් ඉහළ දමන ලදී.

**එක්සත් ජනපද ආර්ථිකය මන්දගාමී වීම සහ ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම හේතුවෙන් 2006 වසර තුළ දී එක්සත් ජනපද ඩොලරය ගෝලීය වෙළෙඳපොළ තුළ විශේෂයෙන් ප්‍රධාන මුදල් මාර්ගවලට එරෙහිව දුර්වල විය.** ජපන් යෙන්වලට එරෙහිව සුළු වශයෙන් අධිප්‍රමාණය වූ අතර, ස්ටර්ලිං පවුමට සහ යුරෝවලට එරෙහිව ඉහළ අගයකින් අවප්‍රමාණය විය. චීන රෙන්මින්බි සමඟ මැලේසියානු රින්ගිට් 2005 සිට එක්සත් ජනපද ඩොලරයට එරෙහිව වඩාත් නම්‍යව පැවතීමට ඉඩ දුන් අතර, එ.ජ.ඩොලරයට එරෙහිව 2006 වසරේ දී ක්‍රමයෙන් අධිප්‍රමාණය වීම සිදුවිය. චීන රෙන්මින්බි තවදුරටත් අධිප්‍රමාණය වීමේ අවශ්‍යතාව මතුකරමින් චීනයේ විදේශීය සංචිත 2006 වසරේ දී එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියනයක සීමාව පසු කරන ලදී. නැගී එන සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් ආසියානු රටවල් පවා ඔවුන්ගේ විදේශීය සංචිත ගොඩනැගීම අඛණ්ඩව සිදුකරනු ලබයි. 2006 වසර තුළ දී නැගී එන වෙළෙඳ ආර්ථිකයන් වාර්තාගත විදේශ විනිමය ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට සමත් විය.

**2001 වසරේ අග භාගයේ දී දෝහා කටාර්හි පැවති අමාත්‍යවරුන්ගේ සම්මන්ත්‍රණයේ ප්‍රතිඵලයක් ලෙස ලෝක වෙළෙඳ සංවිධානය මඟින් දෝහා සංවර්ධන වැඩසටහන යටතේ ඇරඹි බහුපාර්ශ්වික වෙළෙඳ ගනුදෙනු 2006 ජූලි මස දී බිඳ වැටුණි.** දියුණු වෙමින් පවතින රටවලට වෙළෙඳාම සාධාරණ අයුරින් පවත්වා ගැනීම ඉලක්ක කරගෙන ලොව පුරා වෙළෙඳාම අඩු බාධා මධ්‍යයේ කිරීම සඳහා නව වෙළෙඳ ගිවිසුමක් සකස් කිරීම මෙම දෝහා සංවර්ධන වැඩසටහනෙහි අරමුණ විය. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පිවිසුම්, දේශීය කෘෂිකාර්මික සහනාධාර සහ කෘෂිකාර්මික නොවන වෙළෙඳපොළ පිවිසුම් යන කරුණු පදනම් කරගෙන සාමාජික රටවල් විසින් ඇරඹි මෙම සාකච්ඡාවල දී ප්‍රධාන සාමාජික රටවල අදහස්වල වෙනස්කම් පැවතුණි. එබැවින් මෙම බහුපාර්ශ්වීය සාකච්ඡා විසඳිය නොහැකි තුන්කොන් ගැටලුවක් බවට පත් විය. දෝහා වටයේ වෙළෙඳ ගනුදෙනු සාර්ථකවීම සඳහා දියුණු රටවල් දේශීය ගොවි සහනාධාරයන් ඇඩි ලෙස කපා හැරීමට සහ දියුණුවෙමින් පවතින රටවල කෘෂි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පිවිසුම් ලබාදීමට එකඟවිය යුතු අතර, දියුණු වෙමින් පවතින රටවල කාර්මික භාණ්ඩ සඳහා පනවා ඇති බදු අඩු කළ යුතු වේ. කෙසේ වෙතත්, ප්‍රධාන ලෝක බලධාරීන් මේ ගැටලුව සඳහා ඉතා සුළු කැපවීමක් පමණක් පෙන්නුම් කර ඇත.

## 1.3 මැදිකාලීන සාර්ව ආර්ථික දැක්ම, අභියෝග සහ ප්‍රතිපත්ති

**මහින්ද චින්තනයේ සමස්ත ප්‍රතිපත්තිමය දර්ශනය පදනම් කරගත් දස අවුරුදු දැක්ම ස්ථායී සාර්ව ආර්ථික වාතාවරණයක් සහිත ඉහළ මැදිකාලීන ආර්ථික වර්ධනයක් ඉලක්ක කරයි.** ආර්ථිකයේ අංශ තුනෙහිම ඵලදායීතාව වැඩි දියුණු කිරීමෙන් මෙම වර්ධනය ලබාගැනීමට අපේක්ෂා කෙරේ. මැදිකාලීනව කෘෂිකාර්මික අංශය ආසන්න වශයෙන් සියයට 5 කින් වර්ධනය වේයැයි පුරෝකථනය කර ඇති අතර, කාර්මික හා සේවා අංශ දෙක ම ඉහළ වේගයකින් එනම්, පිළිවෙළින් සියයට 8 කට සහ සියයට 9 කට වැඩි අනුපාතිකයකින් වර්ධනය වේ යැයි පුරෝකථනය කර ඇත. මෙම ඉලක්ක කරා ළඟා වීමේ දී යටිතල පහසුකම්, මානව ප්‍රාග්ධනය, කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා වැනි අංශ සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙහි ම ඉහළ ආයෝජන අවශ්‍ය වේ. ලෝක ආර්ථිකයේ ශක්තිමත් වර්ධනයේ සහාය ද ලබමින්, ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවල ඉදිකිරීම් සමඟ දැනට පවතින වර්ධනීය තත්ත්වය මැදි කාලීන ව අඛණ්ඩව ක්‍රියාත්මක වේ යැයි අපේක්ෂා කෙරේ. මැදි කාලීන ඉහළ වර්ධන මාවතට සහාය දක්වමින් විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් වේ යැයි අපේක්ෂිත ය. 2006 දී වර්තාගත මට්ටමකට ළඟා වූ විදේශීය සෘජු ආයෝජන ඉන්දියාව සහ පකිස්තානය සමඟ වූ නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ පවත්නා ඉහළ ආයෝජන අවස්ථා සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ආයෝජන මණ්ඩලය මඟින් ගනුලැබූ නොයෙකුත් ක්‍රියාමාර්ග වල ප්‍රතිඵලයක් වශයෙන් මැදි කාලීන ව වැඩි දුරටත් වර්ධනය වීම අපේක්ෂා කරයි. 2006 අවසන් වන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 4.5 ක විදේශ ආධාර ලැබීමට නියමිතව තිබුණි. 2007 ජනවාරි මස ගාල්ලේ දී පැවැත්වුණු ශ්‍රී ලංකා සංවර්ධන සමුළුවේ දී මැදි කාලීනව එක්සත් ජනපද ඩොලර් බිලියන 9 කට වඩා මුළු සංවර්ධන සහයෝගීතාව ඉහළ නැංවීමේ අරමුණින්, තවත් එක්සත් ජනපද ඩොලර් බිලියන 4.5 ක සංවර්ධන ආධාර ලබා ගැනීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ තවදුරටත් සාකච්ඡා ආරම්භ කෙරුණි. රාජ්‍ය මූල්‍ය අංශයේ ආදායම් රැස්කිරීම් ක්‍රමයෙන් සියයට 19 ක් පමණ දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර, ණය කළමනාකරණය වැඩි දියුණු වීම, පොලී වියදම් අඩු කිරීම සහ මහජන සේවා සැපයීම් වැඩි දියුණුවීම මඟින් වර්තන වියදම්

පාලනය කිරීම ඉලක්කකර ඇත. රාජ්‍ය මූල්‍ය වගකීම් පනත මගින් අපේක්ෂා කරන ආකාරයට, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන් මගින් මැදිකාලීන ව අය වැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 5 ක් පමණ දක්වා අඩු කිරීමට අපේක්ෂා කරන අතර, මුළු රාජ්‍ය ණය තොගය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 85 කට වඩා අඩු මට්ටමක් දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

**දස අවුරුදු දැක්ම, 2007 අවසන් වන විට උද්ධමනය එක් අංකයක මට්ටමක් දක්වා පහත හෙළීමටත්, මැදි කාලයේ දී තවදුරටත් ආසන්න වශයෙන් සියයට 4-6 දක්වා අඩු කිරීමටත් ඉලක්ක කරයි.** 2007 සහ ඉන් ඉදිරිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම මගින් ප්‍රකාශයට පත් කළ ආකාරයට, උද්ධමන පීඩනය පාලනය කිරීම සහ මැදිකාලීනව උද්ධමනය එක් අංකයක මට්ටමක් දක්වා අඩු කිරීම ඉලක්ක කරමින්, ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා සහයෝගය දැක්වීම අරමුණු කරගෙන මුදල් ප්‍රතිපත්තිය යොමු වනු ඇත. අඩු සහ ස්ථාවර උද්ධමනය ආර්ථික වර්ධන ඉලක්ක කරා ළඟා වීමට පූර්ව අවශ්‍යතාවකි.

**ඉහළ වර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා, පොදු හා පෞද්ගලික ආයෝජන ප්‍රමාණවත් ලෙස වර්ධනය වීම අවශ්‍යය.** රජය විසින් හඳුනාගත් ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති නිසිකලට ක්‍රියාත්මක කිරීම මගින් යටිතල පහසුකම් හා සම්බන්ධ අවහිරතා ඉවත් කරනු ඇති අතර, එමගින් ආයෝජන වර්ධනය සඳහා පහසුකම් සලසනු ඇත. කෙසේ වුවද, මේ සඳහා අති විශාල මූල්‍ය සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය වේ. මෙම ව්‍යාපෘති

**1.5 සංඛ්‍යා සටහන**

**මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව 2006-2010 (අ)**

| දර්ශකය | ඒකකය | 2006 (ආ) | පුරෝකථන | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2007 | 2008 | 2009 | 2010 |
| **මූර්ත අංශය** | | | | | | |
| වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | **2,802** | **3,267** | **3,777** | **4,336** | **4,965** |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 7.4 | 7.5 | 8.0 | 8.3 | 8.5 |
| උද්ධමනය/ද.දේ.නි. අවධමනකය | සියයට | 10.3 | 8.5 | 7.0 | 6.0 | 5.5 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 28.7 | 32.0 | 32.5 | 33.0 | 33.5 |
| පෞද්ගලික අයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 22.6 | 23.8 | 24.5 | 24.9 | 25.3 |
| රජයේ ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 6.1 | 8.2 | 8.0 | 8.1 | 8.2 |
| ප්‍රාග්ධන නිමැවුම් වෘද්ධි අනුපාතය | ද.දේ.නි.යේ % වශයෙන් | 3.6 | 4.0 | 4.0 | 3.9 | 3.9 |
| දේශීය ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 17.1 | 19.8 | 20.1 | 20.7 | 21.5 |
| පෞද්ගලික ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 19.5 | 19.7 | 19.0 | 18.5 | 18.9 |
| රජයේ ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | -2.4 | 0.1 | 1.1 | 2.1 | 2.6 |
| ජාතික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 23.4 | 26.8 | 27.6 | 28.3 | 29.1 |
| **විදේශීය අංශය** | | | | | | |
| වෙළෙඳ පරතරය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | -3,370 | -3,961 | -4,583 | -5,170 | -5,649 |
| අපනයන | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 6,883 | 7,569 | 8,343 | 9,210 | 10,168 |
| ආනයන | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 10,253 | 11,531 | 12,927 | 14,380 | 15,817 |
| සේවා | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 257 | 320 | 404 | 512 | 575 |
| ලැබීම් | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 1,625 | 1,855 | 2,099 | 2,377 | 2,612 |
| ගෙවීම් | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 1,368 | 1,535 | 1,694 | 1,865 | 2,037 |
| ජංගම ගිණුමේ ශේෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | -1,334 | -1,481 | -1,555 | -1,703 | -1,827 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -4.9 | -5.0 | -4.6 | -4.5 | -4.3 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | 204 | 300 | 372 | 393 | 530 |
| විදේශීය නිල සංචිත (ආනයනික මාස) | මාස | 3.0 | 2.9 | 2.9 | 2.9 | 3.0 |
| ණය සේවා අනුපාතය (ඇ) | ප්‍රතිශතය | 12.8 | 10.8 | 11.4 | 11.8 | 8.8 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | | | |
| ආදායම | ද.දේ.නි.යේ % වශයෙන් | 17.0 | 18.9 | 19.0 | 19.2 | 19.3 |
| වියදම | ද.දේ.නි.යේ % වශයෙන් | 25.4 | 26.4 | 25.4 | 24.5 | 24.3 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -2.5 | 0.1 | 1.1 | 2.1 | 2.6 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -8.4 | -7.6 | -6.3 | -5.3 | -5.0 |
| දේශීය මූල්‍යනය | ද.දේ.නි.යේ % වශයෙන් | 5.8 | 4.7 | 3.7 | 3.1 | 2.9 |
| **මුදල් අංශය (ඈ)** | | | | | | |
| සංචිත මුදල් වර්ධනය | සියයට | 21.2 | 11.6 | 14.8 | 14.3 | 14.0 |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) | සියයට | 17.8 | 14.8 | 15.0 | 14.5 | 14.4 |
| පටු මුදල් වර්ධනය ($M_1$) | සියයට | 12.6 | 12.8 | 13.0 | 12.5 | 12.4 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වර්ධනය | සියයට | 24.8 | 17.5 | 15.8 | 14.5 | 13.9 |
| රාජ්‍ය අංශයට ණය දීම්වල වර්ධනය | සියයට | 39.4 | 2.1 | -0.6 | -0.4 | -0.7 |

(අ) 2007 මාර්තු මැද වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) තාවකාලික
(ඇ) මුළු ණය සේවා ගෙවීම් වෙළෙඳ භාණ්ඩ අපනයන සහ සේවාවන්ගේ ඉපැයීම්වල ප්‍රතිශතයක් වශයෙන්
(ඈ) වර්ෂය අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලයන් : මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍යනය කිරීම සඳහා රජයට ලැබීමට නියමිත විදේශීය සංවර්ධන සහකරුවන්ගේ ණය ආධාර අරමුදල් උපරිම වශයෙන් උපයෝජනය කිරීම අවශ්‍ය වන අතර, දේශීය වෙළෙඳපොළෙහි පෞද්ගලික අංශයට භාවිතා කිරීමට ඇති සම්පත්වලට බලපෑමක් ඇති නොකර ජාත්‍යන්තර අරමුදල් සපයා ගැනීම යෝග්‍ය වේ. ආර්ථිකයේ පෞද්ගලික ආයෝජන ධෛර්යමත් කිරීම සඳහා උපකාරී වන යෝග්‍ය ආයෝජන වාතාවරණයක් සහ යහපත් සාර්ව ආර්ථික පරිසරයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන්, උද්ධමනය තනි අංකයක මට්ටමේ පාලනය කරමින් නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑම තුළින් ආයෝජන විශ්වසනීයත්වය වැඩි දියුණු වනු ඇත.

**සේවා වියුක්තිය අඩු වීමේ ප්‍රවණතාවය සම්බන්ධයෙන් සලකන විට, ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා විශේෂයෙන් ජාතික ඵලදායීතාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.** මෑත කාලීන ව සිදුවූ ඉහළ ආර්ථික ප්‍රසාරණය සහ ආර්ථිකයේ ඇතැම් අංශවල පවතින ශ්‍රම ඌනතාව හේතුවෙන් ඉහළ වැටුප් සඳහා ඇති ඉල්ලුමේ අවදානම් විදහා දක්වමින්, 2006 දී විරැකියා අනුපාතිකය සැලකිය යුතු ලෙස පහත වැටුණි. යම් සැලකිය යුතු මට්ටමක වැටුප් වැඩිවීමක් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමන පීඩනයක් ඇති කිරීමටත් එමගින් රටේ විදේශීය තරගකාරීත්වය පිරිහීමටත් හේතුවනු ඇත. ඉහළ යන වැටුප් මගින් ඇතිවන බලපෑම අවම කිරීමට සහ තරගකාරීත්වය පවත්වා ගැනීමට ආර්ථිකයේ සියලු අංශවල ඵලදායීතාවය වැඩි දියුණු කළ යුතුය. මේ සම්බන්ධව, ආර්ථිකයේ සියලු අංශයන්ගේ ජාතික ඵලදායීතාව වර්ධනය කිරීමට සියළු පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සහ ඵලදායිතා වර්ධනය සම්බන්ධ ඔවුන්ගේ දැනුම්වත්බව වැඩි කිරීම සඳහා සියලු අදාළ පාර්ශ්වයන්ගේ සාමූහික උත්සාහය උපකාරී විය හැකි ය. පර්යේෂණ සහ සංවර්ධන සඳහා වැඩි වශයෙන් වියදම් දැරීම මගින් නවෝත්පාදන, තාක්ෂණ සහ ධනය උත්පාදනය කිරීම ඔස්සේ රටේ සමෘද්ධිමත්භාවයට මග පෙන්වමින් ඵලදායීතාවය සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය තව දුරටත් වර්ධනය කරනු ඇත.

**අපේක්ෂිත ඉහළ ආර්ථික වර්ධන මට්ටම ළඟා කර ගැනීමෙහිලා විදුලිබලය ප්‍රමාණවත්ව සහ විශ්වසනීයත්වයකින් යුතුව තරගකාරී මිලට සැපයුම අත්‍යවශ්‍ය වේ.** අධ්‍යයනයන් මගින් පෙන්වා දී ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතයේ එක් ප්‍රතිශතාංකයක වර්ධනය සඳහා සියයට 1.5-2.0 අතර ප්‍රමාණයක විදුලි බල සැපයුමේ වර්ධනයක් සිදුවිය යුතු බවයි. දිගු කලක් තිස්සේ ප්‍රමාදව පැවති මහා පරිමාණ ගල් අඟුරු සහ ජල විදුලි බලාගාර ඉදිකිරීම් කටයුතු ඇරඹීමට තීරණය කර ඇතත්, එම බලාගාරවලින් විදුලි බල සැපයුම ආරම්භවනු ඇත්තේ වසර 2010 න් පසුව ය. දැනට සැලසුම් කර ඇති ඉතා ඉක්මණින් කටයුතු ඇරඹීමට නියමිත මෙගවොට් 300 ක ධාරිතාවකින් යුත් කෙරවලපිටිය තාප විදුලි බලාගාරය වුව ද විදුලිබලය උත්පාදනය කරනු ඇත්තේ 2008 දෙවැනි භාගයේ දී ය. එම නිසා විදුලිබල සැපයුමට ඇතිවන යම් බාධාවන් මගින් අයහපත් ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක ඇති කෙරෙන හෙයින්, විදුලි බල හිඟය මගහැරීම සඳහා හදිසි පූර්වෝපාය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. අතීතයේ සිදුකළ අන්දමට විදුලිබල හිඟය මග හැරීම සඳහා අතිශය ඉහළ මිල ගණන් යටතේ හදිසි බලශක්තීන් භාවිතා කිරීම, ලංකා විදුලිබල මණ්ඩලයේ දැනටමත් පවතින දුර්වල මූල්‍ය තත්ත්වය මත තවදුරටත් බලපෑම් කරනු ඇත. එබැවින් යම් විදුලිබල හිඟයක් ඇතිවීම මග හැරවීම සඳහා ජල විදුලි බලාගාර ආශ්‍රිත ජලාශයන්හි ජල නිකුතුව කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම, පවත්නා තාප විදුලි ධාරිතාව උපරිම ලෙස භාවිතා කිරීම, ස්වයං උත්පාදන ක්‍රම යළිත් ඇති කිරීම සහ වඩාත් වැදගත්වන බලශක්ති සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදී හදිසි විකල්ප ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

**කලාපය තුළ තවදුරටත් තරගකාරී බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාව විසින් ආයෝජන හිතකාමී පරිසරයක් වර්ධනය කිරීම සඳහා නව ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුතුය.** ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය, බදු කරණය හා බදු පරිපාලනය, අධිකරණ පද්ධතිය හා ආරවුල් සමථයකට පත් කිරීම, ව්‍යාපාර ලියාපදිංචිය, රේගු පිළිවෙත්, අධ්‍යාපනය යන අංශවල තවදුරටත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය. මේ සමග ම, සියලු ම පාර්ශ්වකරුවන් සඳහා තොරතුරු මනා ලෙස බෙදාහැරීම හා හෙළිදරව් කිරීම මගින් විනිවිදභාවය වර්ධනය කිරීම හා නියාමනය වර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම තුළින් දූෂණය හා අයුතු ප්‍රතිලාභ ලැබීමේ (Rent Seeking) අවස්ථා අවම කිරීම හරහා සමස්ත යහපාලනය වර්ධනය කිරීම ද වැදගත් වේ.

**ශ්‍රී ලංකාවේ මැදිකාලීන අපනයන උපාය මාර්ග වැඩි වශයෙන් සේවා පදනම් කරගත් අපනයන හා, විශේෂයෙන් ම කෘෂිකාර්මික අපනයන වැනි ඉහළ එකතු කළ අගයක් ලබා දෙන අපනයන භාණ්ඩ විවිධාංගීකරණය කෙරෙහි යොමුවීම අවශ්‍යය.** අඩු වැටුප් සහිත රටක් වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පවත්නා සාපේක්ෂ වාසිදායක තත්ත්වය, ඒක පුද්ගල ආදායම ඉහළ යෑම සහ මනා අධ්‍යාපනයක් ලත් ශ්‍රම බලකාය නිසා ශීඝ්‍රයෙන් අඩුවෙමින් පවතින නිසා අපනයන භාණ්ඩ හා සේවාවල අඛණ්ඩ වර්ධනයක් පවත්වා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සේවාවන් සහ වෘත්තීය සේවාවන් වැනි වඩාත් දැනුම පදනම් කරගත් අපනයනයන් ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ. තේ, රබර්, පොල් වැනි සාම්ප්‍රදායික කෘෂිකාර්මික ද්‍රව්‍යයන්හි නිමැවුම තවදුරටත් වර්ධනය කිරීමට පවතින ස්වාභාවික අවහිරතාවයන් නිසා ප්‍රමිතිගත කිරීම, වටිනාකම් එකතු කිරීම සහ බෝග විවිධාංගිකරණය කිරීම මැදි කාලීන තිරසාර අපනයන වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය වේ.

**පසුගිය වසර දෙක තුළ පංගු රහිත වෙළෙඳ පරිසරයකට සාර්ථකව මුහුණ දුන් ශ්‍රී ලාංකික ඇඟලුම් අපනයන, 2008 දී එක්සත් ජනපද වෙළෙඳපොළට චීනයේ අපනයන සඳහා පවත්නා සම්බාධක ඉවත්කිරීමත් සමඟ දැඩි තරඟකාරීත්වයකට මුහුණ දෙනු ඇත.** නිෂ්පාදිත ගුණාත්මක බව වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තර කම්කරු සහ යහ පාලන අවශ්‍යතාවන්ට අනුගත වීම, නිසි කලට සැපයීම, තරගකාරී මිලකරණය, ශ්‍රම බලකායෙහි කුසලතා වර්ධනය කිරීම හා ජාත්‍යන්තරව පිළිගත් ගනුදෙනුකරුවන්ගේ පදනමක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ලාංකික ඇඟළුම් කර්මාන්තය අඛණ්ඩව ප්‍රයත්න දැරිය යුතු වේ. එසේ ම, පොදු වරණීය තීරුබදු ක්‍රමය (GSP+) යටතේ වන ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීමට නම් ඇඟලුම් අපනයනයේ දී ශ්‍රී ලංකාව විසින් අවම වශයෙන් සියයට 50 ක වත් අගය එකතු කිරීමක් කළ යුතු බවට යොදා ඇති වර්තමාන නීති පිළිබඳ නිර්ණායකයට යම් ලිහිල් කිරීමක් ලබා ගැනිම සඳහා අඛණ්ඩව උත්සාහ දැරීම ද වාසිදායක වනු ඇත.

**ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා රජය දැනටමත් කැපවී ඇතත්, ආර්ථිකයේ නව යටිතල පහසුකම් පිළිබඳව ඉදිරියේදී මතුවන අවශ්‍යතා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරත්වය තුළින් මූල්‍යනය වීම අවශ්‍ය වේ.** විදේශීය සහනදායී මූල්‍යනය කිරීම් ක්‍රමයන් අඩු වෙමින් පවතින හෙයින්, යටිතල පහසුකම් මූල්‍යනය කිරීම සඳහා රජය විසින් අඛණ්ඩව උත්සාහ කිරීම අයවැය හිඟය පුළුල් වීමටත්, ණය ගැනීම්හි පිරිවැය ඉහළ යෑමටත් හේතුවනු ඇත. එමෙන් ම, එමගින් නොපියවා ඇති ණය ප්‍රමාණය ඉහළ නැංවීමත්, ආපසු ගෙවීම් වඩාත් පීඩාකාරී වීමත් සිදුවන බැවින් අවසාන වශයෙන් සමගාමී යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලට බාධා වීමක් සිදුවේ. මේ අනුව, දිගුකාලීන අයවැය ස්ථායිතාවයක් පවත්වා ගැනීමට හේතුවන පරිදි යටිතල පහසුකම් සඳහා වන ආයෝජනයන්ට සහාය වීම පිණිස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් ක්‍රියාකාරී ලෙස හැකි ඉක්මණින් ප්‍රවර්ධනය කළ යුතු වේ. ලාභාංශ, බදු ආදායම් හා ප්‍රාග්ධන ලාභ ස්වභාවයෙන් රාජ්‍ය ආදායම් ජනිත කිරීමේ අනාගත ප්‍රභවයක් ලෙස ද රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය තුළින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සැලකිය හැකිය. මෙමෙ ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයන්ගේ මනා කුසලතා යොදා ගැනීම තුළින් කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවිය හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඩු පිරිවැයක් සහ වැඩි ගුණාත්මක බවක් ඇතිවීම මෙන්ම රජයේ කොටස් ප්‍රාග්ධනයෙහි ඉහළ යෑමක් ද ඇතිවේ.

**ආර්ථිකයෙහි දැනට පවතින සියයට 7-8 ක වර්ධන මට්ටමේ සිට මැදිකාලීන වශයෙන් සියයට 8-10 අතර ඉහළ වර්ධන මාවතකට එළැඹීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයට ම අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර ගණනාවක වැදගත් ව්‍යුහාත්මක වර්ධනයන් කළ යුතුව ඇත.** රජය වෙතින් සහනාධාර සහ ආරක්ෂණ අපේක්ෂා නොකර, ඵලදායීතා වර්ධනය තුළින් දිනෙන් දින ගෝලීයකරණය වන පරිසරය තුළින් ඉස්මතු වන අභියෝගවලට මුහුණදීම සඳහා පෞද්ගලික අංශය මනාලෙස සූදානම් වීම අවශ්‍යය. සංවර්ධනයේ ඊළඟ අදියරට ළඟාවීම සඳහා ශ්‍රම වෙළෙඳ පොළෙහි ගතික අවශ්‍යතාවන්ට ගැලපෙන කුසලතා සැපයීමට අධ්‍යාපන අංශයට හැකි විය යුතුය. සේව්‍ය සේවක දෙපාර්ශ්වයේ කාර්යයන් හා අවශ්‍යතාවන්හි විවිධාංගීකරණයට අනුව එම මෙහෙයුම් කටයුතුවල ගැළපීම් ඇති කිරීමට දෙපාර්ශ්වය අතර, යම් නම්‍යශීලීභාවයකට ඉඩ සලසන අතර, වැඩි සේවා නියුක්ති අවස්ථා ඇති කරන පරිදි මානව සම්පත් කළමනාකරණය වර්ධනය විය යුතුව ඇත. ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දී පවතින බාධාවන් ඉවත් කිරීම සඳහා නව කළමනාකරණ පරිචයන් හඳුන්වා දීම පෞද්ගලික අංශයෙහි උපරිම විභවතාව ළඟා කර ගැනීමේ පූර්ව අවශ්‍යතාවකි. රටේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 80 ක් පමණ රජයට හිමි වුව ද, ආයෝජන සඳහා ඉඩම් බෙදා වෙන් කිරීමේ මනා යාන්ත්‍රණයක් නොමැති හෙයින් ආයෝජන සඳහා ඉඩම් හිඟයක් පවතී. අධිකරණ පද්ධතිය තුළින් පෞද්ගලික ඉඩම් ආරවුල් විසඳීම සඳහා ඇතිවන ප්‍රමාද, සීමිත පෞද්ගලික ඉඩම් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට හේතුවී ඇත. මේ අතරම, දැනට පවතින සියයට 6-8 අතර ප්‍රමාණයක ආර්ථික වර්ධනය මැදිකාලීනව සියයට 8-10 අතර ප්‍රමාණයක් දක්වා ගෙන ඒමට නවීන ආර්ථිකයට ගැළපෙන, එමෙන් ම ඉහළ කාර්යක්ෂමතාවකින් යුත් රාජ්‍ය අංශයක් අත්‍යවශ්‍යය.

**දස අවුරුදු දැක්මෙහි අපේක්ෂිත වර්ධනයටත් වඩා ඉහළ විභවතාවයකින් වර්ධනය වීමට හැකි ක්ෂේත්‍ර ගණනාවක් ශ්‍රී ලංකාව සතු ය.** අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ මනා ලෙස ඉලක්කගත වූ ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරන්නේ නම් කෙටි කලක් තුළ දී එ.ජ. ඩොලර් බිලියනයකට අධික ප්‍රමාණයක් ඉපැයීමේ හැකියාව සංචාරක ව්‍යාපාරය සතුය. කලාපයේ මේ වන විට ප්‍රචලිත සංචාරක පුරවර හා සසඳන විට වඩාත් විවිධාංගීකරණය වූ සංචාරක ආකර්ෂණ ශ්‍රී ලංකාව සතුය. තේ කර්මාන්තය පිළිබඳව සලකන විට අගය එකතු කිරීම කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම සහ තොග වශයෙන් අපනයනය කරනු වෙනුවට ලංකා තේ යන වෙළෙඳ නාමය ප්‍රවර්ධනය කිරීම තුළින් තේ කර්මාන්තය එක්සත් ජනපද ඩොලර් බිලියන දෙකක් උපයන අපනයන කර්මාන්තයක් බවට පත්කිරීමේ හැකියාව ඇත. එමෙන්ම, විශේෂීකරණය, පසු බැඳුම් සම්බන්ධතා සහ අලෙවිකරණ උපායමාර්ගයන්හි අඛණ්ඩව සිදුකරනු ලබන වැඩි දියුණු කිරීම් තුළින් ලාංකීය ඇඟලුම් කර්මාන්තය එක්සත් ජනපද ඩොලර් බිලියන පහක් පමණ වටිනා කර්මාන්තයක් බවට ඉතා ම ඉක්මණින් පත්වීමේ හැකියාව ඇත. විදේශීය ප්‍රේෂණ නැංවීමට අඛණ්ඩ උත්සාහයන් දැරීම තුළින් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හරහා එ. ජ. ඩොලර් බිලියන 4 ක විදේශ විනිමය ඉපයීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාවට ඩොලර් බිලියන 4 කටත් වඩා ඍජු විදේශ ආයෝජන ලබා ගැනීමට හැකියාවක් ඇති බව දැනටමත් පෙනී යයි. මෙවැනි ඉලක්ක ළඟාකර ගැනීම තුළින් අපේක්ෂිත කාලයටත් වඩා ඉක්මණින් දස අවුරුදු දැක්මෙහි දක්වා ඇති වර්ධනයටත් වඩා ඉහළ වර්ධන මාවතකට ගමන් කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇත.

**විශේෂ සටහන 3** | **දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව : 2006 - 2016**



2007 රජයේ අයවැය සමග 2006 නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුව *'මහින්ද චින්තනය'* අනුව සකස් කර ඇති පුළුල් ප්‍රතිපත්ති රාමුවකි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය සහ සියලු පාර්ශ්වකරුවන් අතර උපදේශන ක්‍රියාදාමයක් තුළින් දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුව සකස් කර තිබේ. තිරසාර පදනමක් මත ප්‍රාදේශීය ආර්ථික විෂමතාවන් සහ දිළිඳුබව අඩු කිරීමට හැකිවන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යටිතල පහසුකම් සහ දැනුම පදනම් කරගත් කඩිනම් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම ඉලක්ක කරගත්, ඉදිරි වසර දහය ඇතුළත රජයේ උපායමාර්ගික ප්‍රතිපත්ති දිශාව මෙමගින් පෙන්නුම් කරයි.

දස අවුරුදු දැක්මෙහි ඇතුළත් සාර්ව ආර්ථික රාමුව තුළින් ක්‍රමිකව අඩුවන උද්ධමනය හා වැඩි දියුණුවන ඵලදායිතාවය වැනි යහපත් ප්‍රවණතාවන් සමග ඉදිරි වසර 6 ඇතුළත සියයට 8 ක ආර්ථික වර්ධනයක් සහ අනතුරුව සියයට 9-10 පමණ ආර්ථික වර්ධනයක් ඉලක්ක කරයි. පෞද්ගලික අංශයේ වැඩි දියුණු වූ ඉතිරිකිරීම්, විදේශ සම්පත් හා රජයේ අයවැය හිඟය ක්‍රමිකව අඩුකිරීම මගින් ඉතිරි කරගන්නා අරමුදල් යොදාගනිමින් ආයෝජන කැපී පෙනෙන ලෙස වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. ආර්ථික කටයුතු තිරසාර පදනමක් මත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සපයමින් ඉල්ලුම හේතුවෙන් ඇතිවන උද්ධමනය වැළැක්වීම සඳහා මුදල් ප්‍රතිපත්තිය යොදාගනු ලැබේ. හිතකර නිල සංචිත මට්ටමක් පවත්වා ගැනීම තුළින් ශක්තිමත්ව පාවෙන විනිමය අනුපාත ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

පහත සඳහන් සටහන මගින් දස අවුරුදු දැක්මෙහි ප්‍රධාන ලක්ෂණ දක්වා ඇත.

සටහන වි.ස. 3.1

**අංශ අනුව සාරාංශගත රජයේ දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව : 2006 - 2016**

| අංශය සහ සංවර්ධන දැක්ම/ අපේක්ෂාව/අරමුණු | ප්‍රතිපත්ති රාමුව/ ප්‍රතිපත්තිමය දිශාව / උපාය මාර්ග/ ප්‍රධාන ඉලක්ක |
|---|---|
| කෘෂිකර්මය :<br>*සම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මාන්තය, වාණිජමය මුහුණුවරක් ගත් සහ ඉහළ ඵලදායීතාවයෙන් යුත් අංශයක් බවට පරිවර්තනය කිරීම.* | - ඵලදායීතාවයෙන් අඩු යැපුම් ගොවිතැන, කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත ඇතුළුව ඉහළ ඵලදායීතාවකින් යුක්ත දියුණු කෘෂිකර්මාන්තයක් බවට පරිවර්තනය කිරීම.<br>- වැවිලි කර්මාන්තය ඇතුළුව අපනයන පදනම් කර ගත් කෘෂිකාර්මික අංශයන්හි ඵලදායීතාව, නිෂ්පාදනය සහ තරඟකාරීබව ඉහළ නැංවීම.<br>- ග්‍රාමීය දිළිඳුබව අඩු කිරීම සඳහා ඍජුවම දායක වන ලෙස ශ්‍රමය, භූමිය සහ අනෙකුත් නිෂ්පාදන සාධකවලින් ලැබෙන ප්‍රතිලාභ ඉහළ නැංවීම.<br>- නවීකරණය සහ තාක්ෂණික පරිවර්තනය හරහා කෘෂිකාර්මික ඵලදායීතා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම.<br>- වෙළෙඳපොළාභිමුඛ මිල ගණන් සහ දිරිගැන්වීම් සහිත වාතාවරණයක් ඇති කිරීම.<br>- කෘෂිකාර්මික අංශය තුළ සුළු හා මධ්‍ය පරිමාණ කාර්යයන්හි වාණිජමය මුහුණුවර වැඩි කරමින් වැවිලි නොවන අංශයේ ඉහළ දායකත්වය සමග සියයට 4-5 ක පමණ වේගවත් වර්ධනයක් ළඟාකර ගැනීම. |
| වාරිමාර්ග :<br>*ඵලදායී ලෙස ජල භාවිතය ඉහළ නැංවීම තුළින් වාරි කෘෂිකර්මය, තාක්ෂණික වශයෙන් උසස් සහ වාණිජමය වශයෙන් ශක්තිමත් අංශයක් බවට පරිවර්තනය කිරීම.* | - වාරි ජලය භාවිතා කිරීමේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.<br>- පවතින වාරිමාර්ග පද්ධති යථා තත්ත්වයට පත්කිරීම සඳහා ආයෝජනය කිරීම සහ නව වාරිමාර්ග පද්ධති සංවර්ධනය කිරීම.<br>- ජලය බෙදාහැරීමේ / යෙදවීමේ ක්‍රම ප්‍රවර්ධනය කිරීම.<br>- කුඩා වැව් සහ සුළු පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම.<br>- ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සහ ධාරිතාව වැඩිකිරීම. |
| කාර්මික සංවර්ධනය :<br>*පුළුල් අවස්ථා ලබා දීම සඳහා තිරසාර රැකියා අවස්ථා සහ ඉහළ එකතු කළ අගයන් සහ වැඩි ඵලදායීතාවයක් උත්පාදනය කිරීම සඳහා තරඟකාරී සහ* | - කාර්මික විසඳුම් කළමනාකරණය සඳහා වන ජාතික විභවතාවය සංවර්ධනය කිරීම.<br>- කර්මාන්තවල තරඟකාරිත්වය වර්ධනය කිරීම ඉහළ නැංවීම සඳහා ජාතික නව සොයාගැනීම් ක්‍රමය ශක්තිමත් කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල තරඟකාරිත්වය වර්ධනය කිරීම.<br>- ක්ෂුද්‍ර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.<br>- ආයතන සඳහා තරඟකාරී ප්‍රතිලාභ ඇති කිරීමට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>- භූගෝලීය පදනමක් මත කාර්මික පර්ෂද (Clusters) සහ කාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම. |

| | |
|---|---|
| *තියුණු පදනමකින් යුත් කාර්මික නිෂ්පාදන ආයතන ඇති කිරීම.* | - කාර්මික අනුපූරකතාවන් ශක්තිමත් කිරීම සහ විදේශීය ඍජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම. |
| **විදුලිබලය සහ බලශක්තිය :**<br>*ස්වාධීන නියාමනයට යටත්, වාණිජමය වශයෙන් ශක්තිමත් ආයතන හරහා තරගකාරී මිල ගණන් යටතේ සමස්ත ජනගහනයටම බලශක්ති සේවා ලබාගැනීමට ඇති හැකියාව හා භාවිතය සඳහා බලශක්ති මූලාශ්‍ර, පරිවර්තන පහසුකම් සහ බෙදාහැරීම් ක්‍රම තිරසාර පදනමකින් සංවර්ධනය කිරීම.* | - සම්ප්‍රදායික විදුලිබල මූලාශ්‍ර සහ සම්ප්‍රදායික නොවන පුනර්ජනන බලශක්ති යන අංශ දෙකෙහිම ආයෝජනය වැඩි කිරීම මගින් ඉන්ධන විවිධාංගීකරණය සහ බලශක්ති ආරක්ෂණය.<br>- වර්ෂ 2016 වන විට ගෘහ ඒකකවලින් සියයට 95 ක් ආවරණය වන පරිදි විදුලිබලය සැපයීම සහතික කිරීමට ජාතික විදුලිබල පද්ධතියේ මෙන්ම ජාතික විදුලිබල පද්ධතියෙන් පරිබාහිර බලශක්ති සේවා සැපයුම සඳහා ආයෝජනය කිරීම.<br>- වියදම පිළිබිඹුවන ආකාරයේ ගාස්තු ක්‍රමයක් සහ නිවාස ආලෝකකරණය සඳහා පොදු පාරිභෝගික සහනාධාරයක් හඳුන්වාදීම.<br>- මූල්‍ය දුෂ්කරතා අවමකර ගැනීම සඳහා විදුලිබල ක්ෂේත්‍රයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම.<br>- බලශක්ති තොග වශයෙන් නිපදවීමේදී ඉන්ධන විවිධාංගීකරණය සහ බලශක්ති ආරක්ෂණය සඳහා ඛනිජ තෙල් හෝ ඛනිජ තෙල් ආශ්‍රිත ඉන්ධන මගින් විදුලිය නිපදවන බලාගාර ප්‍රමාණය අඩුකිරීම හා ගල් අඟුරු හා පුනර්ජනන බලශක්ති කරා විවිධාංගීකරණය කිරීම.<br>- ප්‍රධාන විදුලිබල පද්ධතියේ ඇති බාධක ඉවත්කිරීම සහ පුනර්ජනන බලශක්ති වැඩි දියුණු කිරීම සඳහා අරමුදල් පිළියෙල කර දීම.<br>- විදුලිබලය සැපයීමේ ආරක්ෂක බව, ගුණාත්මක බව හා විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා බෙදාහැරීම හා සම්ප්‍රේෂණය සඳහා ආයෝජනය කිරීම. |
| **විදුලි සංදේශ :**<br>*සාධාරණ ගාස්තු යටතේ සියළු දෙනාටම බාධාවකින් තොරව නවීන හා උසස් විදුලි සංදේශ ජාල පහසුකම් ලබාදීම.* | - විදුලි සංදේශ අංශය තරගකාරී ලෙස පවත්වාගෙන යාමට සියලු දුරකථන සපයන්නන් සඳහා සමාන අවස්ථා ලබා දීම ධෛර්යමත් කිරීම.<br>- මානව සම්පත් සංවර්ධනය වැඩි දියුණු කිරීම.<br>- පාරදෘෂ්‍ය ක්‍රියාමාර්ගයක් මගින් වාර්ෂිකව දුරකථන ගාස්තු සංශෝධනය කිරීම.<br>- විදුලි සංඛ්‍යාත සඵලව, ආර්ථික වටිනාකමකින් යුතුව හා ඉතාම කාර්යක්ෂමව යොදාගන්නා බවට සහතික වීම පිණිස වඩා හොඳින් කළමනාකරණය කිරීම. |
| **ජල සැපයුම හා සනීපාරක්ෂාව :**<br>*සියලුම ජනතාවට පිරිසිදු ජලය සහ සනීපාරක්ෂක සේවාවන් සීමාවකින් තොරව සැපයීම.* | - රජයේ ආයෝජන මත වන රැඳියාව අඩු කිරීම සඳහා ක්‍රමිකව විකල්ප මූල්‍ය සම්පාදන මූලාශ්‍ර හඳුනාගැනීම.<br>- අඩු ආදායම් ලබන අයට පමණක් සහන ගාස්තු යටතේ ජලය සපයමින්, නල මගින් ලබාදෙන ජලය සඳහා පිරිවැය පිළිබිඹු කරන ගාස්තු ක්‍රමයක් හඳුන්වා දීම.<br>- නියාමන හා ආයතනික රාමුවක් ගොඩනැගීම.<br>- ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.<br>- සුදුසු ග්‍රාමීය හා නාගරික ජල සැපයුම් කළමනාකරණ උපාය මාර්ග හඳුන්වාදීම. |
| **මාර්ග :**<br>*සියලුම ජනතාව සඳහා මාර්ග ප්‍රවේශ පහසුකම් සැපයීම හා මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා කාර්යක්ෂම උසස් තත්ත්වයේ මාර්ග පද්ධතියක් ගොඩනැගීම.* | - දැනට පවතින මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීමට හා නඩත්තු කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීම.<br>- වඩාත් සැලකිලිමත් ලෙස තෝරාගත් හා ආර්ථික තත්ත්වයට ගැලපෙන නව මහා මාර්ග හා අධිවේගී මාර්ග ඉදිකිරීම.<br>- ප්‍රවාහන කළමනාකරණය කිරීම හා මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව පිළිබඳ වැඩසටහනක් දියත් කිරීම.<br>- ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා *'මග නැගුම'* වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.<br>- ප්‍රවාහන කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස මාර්ග භාවිතය සඳහා මුදල් අයකිරීම, ගුවන් පාලම් ඉදිකිරීම සහ විදුලි සංඥා ක්‍රම ඇතිකිරීමට ක්‍රියාකිරීම.<br>- අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය සඳහා අයෝජන අවස්ථා විවෘත කිරීම. |

| | |
|---|---|
| **ප්‍රවාහන සේවා :**<br>*සමාජීය හා ආර්ථික සංවර්ධනයේ අවශ්‍යතා සඳහා අනුකූල වූ සහ දැරිය හැකි මූල්‍ය අගයකින් යුතු වූ කාර්යක්ෂම හා ආරක්ෂිත ප්‍රවාහන ක්‍රමයක් සැලසීම.* | *සමස්ත ප්‍රවාහන ප්‍රතිපත්තියේ විශේෂිත අවස්ථා:*<br>- ප්‍රවාහන සේවාවන් සඳහා වන ගාස්තු එම සේවාවන් සැපයීමේ දී වන පිරිවැයට සම්බන්ධ කිරීම.<br>- ආර්ථික හා සමාජයීය හේතු මත තීරණය කරන අවස්ථාවලදී පමණක් ප්‍රවාහන සේවා සපයන්නන් හා ලබන්නන් වෙත රජයේ සහනාධාර ප්‍රදානය කිරීම.<br>- එකකින් අනිකට ලබාදෙන ආකාරයේ හරස් සහනාධාර (Cross Subsidies) ලබාදීමෙන් වැළකී සිටීම.<br><br>*දුම්රිය ප්‍රවාහනය : අඩු ගමන් කාලයක්*<br>- මගීන්ට දැනට ලබාදෙන සේවාවන් වැඩිදියුණු කිරීම.<br>- මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම.<br>- නව දුම්රිය මාර්ග ඉදිකිරීම සහ තෝරාගත් මාර්ග ව්‍යාප්ත කිරීම, නවීන තාක්ෂණය හා විදුලි දුම්රිය සේවා හඳුන්වා දීම සහ දුම්රිය මගින් බහාලුම් ප්‍රවාහනයට පහසුකම් වැඩිදියුණු කිරීම යනාදිය මගින් මැදි හා දිගුකාලීනව දුම්රිය ප්‍රවාහනය දියුණු කිරීම.<br><br>*බස් ප්‍රවාහනය : සුවපහසු ආරක්ෂිත ගමනක්*<br>- පුනරුත්ථාපන වැඩසටහනක් හඳුන්වාදීම මගින් දැනට පවතින ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම.<br>- රාජ්‍ය බස් සේවය ශක්තිමත් කිරීම සඳහා නව බස් රථ දැනට පවත්නා බස් ඇණියට එකතු කිරීම, ඒකාබද්ධ දුම්රිය බස් සේවා සැපයීම, පොදු නියාමන ක්‍රියාමාර්ග සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීමට ජාතික ගමනාගමන කොමිසම හා පළාත් සභා දිරිගැන්වීම මගින් රාජ්‍ය බස් සේවා ශක්තිමත් කිරීම. |
| **වරාය :**<br>*ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රධාන නාවික, වෙළෙඳ හා වාණිජ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.* | - ජාත්‍යන්තර වෙළෙඳාමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා රට තුළ පවතින ප්‍රධාන වරායන් සංවර්ධනය කිරිම.<br>- කොළඹ දකුණු වරාය, ගාල්ල හා හම්බන්තොට වරායන් සංවර්ධනය කිරීම මගින් කොළඹ අන්තර්ජාතික වරායේ තදබදය අඩු කිරීම.<br>- හඳුනාගත් පළාත්වල වරායන් සංවර්ධනය කිරීම.<br>- පවත්නා වරායවල රාජ්‍ය අයිතිය තබා ගනිමින් ඒවායේ ධාරිතාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි දියුණු කිරීමට දිරි දීම.<br>- වරායන් වාණිජමය මධ්‍යස්ථානයන් වශයෙන් මෙහෙයවීම සඳහා ඒවායේ වැඩිවන මෙහෙයුම් පිරිවැය කළමනාකරණය කිරීම.<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයෙන් යුත් ව්‍යාපෘතින් වශයෙන් බහාලුම් පර්යන්ත වරායට පිටතින් පිහිටුවීම. |
| **ගුවන් සේවා :**<br>*අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව සුරක්ෂිතභාවය හා ආරක්ෂාව සහතික කරන, කාර්යක්ෂමතාව වැඩි, පිරිවැය අඩු ඵලදායී සහ ක්‍රමානුකූලව වර්ධනය වන තරඟකාරී සිවිල් ගුවන් සේවා පවත්වාගෙන යාම.* | - බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ තුළ ගුවන් බඩු හා මගී ප්‍රවාහන පාලනයේ, සුරක්ෂිතභාවය ඇති කිරීම සහ ආරක්ෂාව වර්ධනය කිරීම වැනි කටයුතු සඳහා රජයේ ආයෝජන යොමු කිරීම.<br>- තෝරාගත් ගුවන්තොටුපොළ හා ගුවන් යානා සේවා සැපයීම සඳහා පෞද්ගලික අංශය සහභාගි කරවා ගැනීම.<br>- ඉල්ලුමට අනුව ප්‍රමාණවත් උසස් මට්ටමේ ගුවන් තොටුපොළ යටිතල පහසුකම් සැපයීම.<br>- ද්විපාර්ශ්වික විවෘත ගුවන් තල ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකාව හා අනෙකුත් රටවල් අතර ඇති සම්බන්ධතාවය වර්ධනය කිරීම.<br>- අන්තර්ජාතික ගුවන් සේවා සැපයීම සඳහා විවිධ දේශීය ගුවන් සේවාවන් ධෛර්යමත් කිරීම.<br>- නව ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සහ දැනට පවතින ගුවන් තොටුපොළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයෙන් සිදුකිරීමට උනන්දු කරවීම. |
| **තැපැල් අංශය :**<br>*වඩා හොඳ සේවයක්, පාරිභෝගික අවශ්‍යතා සඳහා උසස් අනුකූලතාවයක් ලබාදීම, මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කර ගැනීම සහ තැපැල් සේවාවේ යටිතල පහසුකම් උපරිම ලෙස භාවිතා කිරීම යනාදිය සහතික කිරීම.* | - සෑම 'ජන සභා' ලේකම් කාර්යාලයක් තුළම තැපැල් සේවා සැපයීම මගින් තැපැල් සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව වැඩි කිරීම සහ විවිධ සේවාවන් සැපයීම මගින් අමතර ආදායම් මූලාශ්‍රයන් කෙරෙහි යොමුවීම.<br>- ප්‍රධාන කළමනාකරණ සේවා අංශ තුළ කටයුතු විධිමත් කිරීමෙන් වැඩිවන මූල්‍ය හිඟය අඩු කිරීම.<br>- ඉහළයන වියදම, තරඟකාරිත්වය හා බෙදාහරින ලිපි ප්‍රමාණය සලකමින් තැපැල් ගාස්තු ක්‍රමයක් ඇති කිරීම.<br>- තැපැල් දෙපාර්තමේන්තුව සඳහා ව්‍යාපාරික සැලසුමක් සකස් කිරීම හා 2007 වසරේ සිට ඉදිරියට එය ක්‍රියාත්මක කිරීම.<br>- තැපැල් වෙළෙඳපොළෙහි සිදුවන හීනවීම නැවැත්වීම සඳහා විවිධ වෙළෙඳපොළ ක්‍රමෝපායයන් හඳුන්වාදීම. |

| | |
|---|---|
| **සංචාරක කටයුතු :**<br>*දකුණු ආසියානු කලාපය තුළ ප්‍රධානතම සංචාරක දේශාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම.* | - ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයේ කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.<br>- ජාත්‍යන්තර හා දේශීය යන දෙආකාර සංචාරකයන් සඳහා වැඩිදියුණු කළ ක්‍රියාකාරකම් සහ විශේෂ සහන ලබාදෙමින් සංචාරක කලාප සංවර්ධනය කිරීම.<br>- ශීඝ්‍ර ලෙස මතුවෙමින් පවතින ප්‍රධාන වෙළෙඳපොළවල ශ්‍රී ලංකාව වැඩි වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථිර වෙළෙඳ ප්‍රචාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.<br>- වසර 2015 වන විට ඉලක්ක කොට ඇති හෝටල් කාමර 30,000 ක ධාරිතාව සපුරා ගනිමින් නූතන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. |
| **නාගරික සංවර්ධනය හා මානව ජනාවාස :**<br>*සියලුම පුරවැසියන් සුව පහසු අභිමානවත් හා සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීම සහතික කෙරෙන ක්‍රමවත් නාගරික සංවර්ධන ක්‍රියාවලියක් බිහිකිරීම.* | - ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැළපෙන පරිදි කොළඹ නගරය හා එහි පරිසරය සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම සහ කොළඹ නගරයේ අඩුපහසුකම් සහිත ජනාවාස පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව වැඩි දියුණු කිරීම සහ නගරයේ ව්‍යාපාරික කටයුතු සඳහා යෝග්‍ය හා වටිනා ඉඩම් නිදහස් කිරීම.<br>- ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලිය පණගැන්වීම සඳහා යම්කිසි තේමාවන් යටතේ ප්‍රාදේශීය නගර සංවර්ධනය කිරීම.<br>- භූගෝලීය වශයෙන් තුලනාත්මක සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික මට්ටමේ නාගරික වර්ධන කේන්ද්‍ර ස්ථාපිත කිරීම.<br>- දිවයින පුරා ඇති මධ්‍යම හා කුඩා පරිමාණ නගර ද්විතීයික හා තෘතීයික මට්ටමේ නගර වශයෙන් සංවර්ධනය කිරීම.<br>- අවිධිමත් හා නීතිරීතිවලට පටහැනි ලෙස සිදුවන ව්‍යාපාරික කටයුතුවලට පිළියම් යෙදීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ යෝග්‍ය නීතිමය රාමුවක් ස්ථාපිත කිරීම හා පවතින නීතිරීති තවදුරටත් ශක්තිමත් කිරීම. |
| **ජීවනෝපාය සංවර්ධනය සහ සමාජ ආරක්ෂණය :**<br>*ස්වකීය ජීවනෝපාය සංවර්ධනය හා ඒවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත්, තම ජීවන මට්ටම් වැඩි දියුණුකර ගැනීම සඳහාත් ජනතාව සවිබල ගැන්වීම.* | - දිළිඳු පවුල් සඳහා අඛණ්ඩ ආදායම් මාර්ග සැපයෙන ජීවනෝපාය සංවර්ධන කටයුතු කෙරෙහි කේන්ද්‍රගත වීම.<br>- සහනදායී අරමුදල් සැපයීම, තාක්ෂණික දැනුම ලබාදීම, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ වෙළෙඳපොළ පහසුකම් සැපයීම වැනි ක්‍රියාමාර්ග හරහා දිළිඳු ජනකොටස් මුල්කොටගත් ජීවනෝපාය සංවර්ධන අවස්ථා උදාකිරීමට සමත් පරිසරයක් නිර්මාණය කිරීම.<br>- සංවර්ධනය සහ දිළිඳුබවෙහි තියුණු ප්‍රාදේශීය විෂමතාවයන් ඉවත් කරලනු පිණිස දිළිඳු ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම පිටුදැකීමේ විශේෂ ව්‍යාපෘති වැඩසටහන්වල ආයෝජනය කිරීම<br>- 'ගම නැගුම' වැඩ සටහන ඉදිරියට පවත්වා ගෙන යාම.<br>- ජීවනෝපාය සංවර්ධන සහ දිළිඳුකම තුරන් කිරීමේ ඵලදායී උපාය මාර්ගයක් ලෙස සුළු පරිමාණ ණය යෝජනා ක්‍රම ප්‍රචලිත කිරීම.<br>- ඍජු මූල්‍ය ප්‍රතිපාදන සැපයීම හරහා සමාජයීය සහ ආර්ථික වශයෙන් අඩු වරප්‍රසාදලාභී පුද්ගලයන්ට සහන සැලසීම අඛණ්ඩව සිදුකිරීම. |
| **අධ්‍යාපනය :**<br>*වේගවත් ආර්ථික වර්ධන වේගයක් සහිතව, ජාතික සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන තාක්ෂණික දැනුම ලබාදෙන අධ්‍යාපන ක්‍රමයක් බවට දැනට පවතින අධ්‍යාපන ක්‍රමය පරිවර්තනය කිරීම.* | *සාමාන්‍ය අධ්‍යාපනය :*<br>- සියලුම ළමයින්ට නිදහස් අධ්‍යාපනය ලබාගැනීමේ අයිතිය තවදුරටත් ආරක්ෂා කරන අතර, සෑම පුද්ගලයෙකුටම ඔහුගේ හෝ ඇයගේ කැමැත්ත හා හැකියාව මත ඉහළ ගුණාත්මක අගයකින් යුත් අධ්‍යාපනයක් ලබාගැනීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම.<br>- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවස්ථා සමාන ලෙස ඇතිකිරීමටත්, සහභාගිත්වය වැඩිකිරීමටත්, ජයග්‍රහණ වෙත ළඟාවීමටත් එහි ප්‍රතිඵල භුක්ති විඳීම වැඩිකිරීමත් අවස්ථාව ලබාදීම.<br>- සම්පත් බෙදාහැරීම, ඒවායේ පාලනය හා කාර්යක්ෂමතාවය ශක්තිමත් කිරීම.<br><br>*වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය :*<br>- වැඩසටහන්වල ගුණාත්මකභාවය හා රැකියාවක් ලබාගැනීමට ඒවායේ අදාළත්වය වැඩි දියුණු කිරීම.<br>- ද්විතීයික පාසල්වලින් පිටවන පාසල් හැර යන්නවුන්ගෙන් සහ රැකියා කරන්නවුන්ගෙන් වෘත්තීය හා කාර්මික පුහුණු ආයතනවලට ඇතුළත් වන ප්‍රමාණය වැඩි කිරීම.<br>- වෘත්තීය හා කාර්මික පුහුණු ආයතනවල කළමනාකරණ කටයුතු සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. |

| | |
|---|---|
| | *උසස් අධ්‍යාපනය :*<br>- රජයේ විශ්ව විද්‍යාල පද්ධතිය විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබාදෙන ප්‍රමුඛ ආයතන ලෙස අනාගතයේ දී පවත්වාගෙන යාම: උපාධි පිරිනමන ආයතන සහ විශ්ව විද්‍යාල නොවන වෙනත් ආයතන, පවතින නීතිමය තත්ත්වයන් අනුව රජයේ විශ්ව විද්‍යාල සමග එකිනෙක හා සහයෝගයෙන් ක්‍රියාත්මක වීමට ඉඩකඩ සලසා දීම.<br>- අධ්‍යාපනයේ ප්‍රධාන සැපයුම්කරුවා ලෙස රජය ඉදිරියටත් කටයුතු කළ ද, උසස් අධ්‍යාපනය සඳහා විවිධ ආයෝජන ලබාගැනීම දිරිමත් කිරීම: විද්‍යාගාර හා පර්යේෂණ සම්පත් වැඩිදියුණු කිරීම හා විශේෂ අධ්‍යාපනය වැනි තෝරාගත් ජාතික ප්‍රමුඛතා ඔස්සේ පර්යේෂණ ධාරිතාවන් හා උපදේශන හැකියාවන් වැඩි කිරීමට හැකි වන ලෙස විශ්ව විද්‍යාල නවීකරණය කිරීම.<br>- ජාතික සංවර්ධනයේ දී ප්‍රමුඛත්වය ලබාදෙන අංශ විශේෂයෙන්ම හැදෑරීම සඳහා කලාපයේ විශිෂ්ට ඉගෙනුම් මධ්‍යස්ථාන ලෙස නැගී සිටීමට දිරිදීම. රටේ ආර්ථික වර්ධන අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මානව සම්පත් සංවර්ධනය කිරීම උදෙසා රජය විසින් නව විශ්වවිද්‍යාල හයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පිහිටුවීම.<br>- මෙතෙක් උපාධි ලබා නොදුන් අංශ කෙරෙහි අවධානය යොමුකරමින් නව උපාධි පාඨමාලා හඳුන්වාදෙන අතර, විශ්වවිද්‍යාල වල දැනට පවතින විෂය මාලා, වෙනස්වන රැකියා අවස්ථාවන්ට අනුකූලව ප්‍රතිසංස්කරණය කිරීමට දිරිමත් කිරීම. |
| **සෞඛ්‍යය :**<br>*දේශීය ආර්ථික, සමාජීය, මානසික සහ ආධ්‍යාත්මික වර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම.* | - සෞඛ්‍ය ප්‍රවර්ධනය, බෝවන හා බෝ නොවන රෝග වැළැක්වීම හා පාලනය කිරීම.<br>- අඩුම පහසුකම් යටතේ ජීවත් වන, අඩු සැලකිල්ලක් ලබන හා අවධානයට ලක්විය යුතු කොටස් සඳහා සේවා සැපයීම.<br>- සෞඛ්‍ය සේවා ලබාදීම සඳහා පෞද්ගලික ආයෝජකයන් දිරිගැන්වීම.<br>- මානව සම්පත් සංවර්ධනය<br>- පවතින සේවාවල අඩුපාඩු මගහැරගනිමින් ඒවායේ ගුණාත්මක තත්ත්වය හා පරාසය වර්ධනය කිරීම.<br>- සෞඛ්‍ය සේවාවල දැනට ඇති ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම.<br>- කාර්යක්ෂමතාවය, ඵලදායීතාව හා වගකීම වැඩි කිරීම සඳහා ආයතන ව්‍යුහය හා කළමනාකරණය ප්‍රතිසංස්කරණය කිරීම.<br>- සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සම්පත් උපරිම ලෙස භාවිතා වන බවට වගබලා ගැනීම. |
| **රැකියා අවස්ථා :**<br>*දිළිඳුභාවයෙන් හා දුෂ්කරතාවයෙන් මිදුණු ගුණාත්මක ජීවිතයක් අත්විඳිය හැකි ආකාරයට සියලුම ශ්‍රමිකයන් සඳහා නිදහස්, සමානාත්මතාවය, ආරක්ෂාව හා මානව ගෞරවය රැකෙන ඵලදායී රැකියාවක යෙදිය හැකි වන පරිදි අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම.* | - රැකියා උත්පාදනය : අවිධිමත් අංශයේ රැකියා වෙත අවධානය යොමු කිරීම, ඌණ සේවා නියුක්තිය අවම කිරීම, පෞද්ගලික අංශය රැකියා සැපයීමේ මූලයක් ලෙස සලකමින් වර්ධනය කිරීම, සුළු, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තවල ශාක්‍යතාවය පිළිබඳ වටහා ගෙන කටයුතු කිරීම සහ ශ්‍රම සංක්‍රමණික කළමනාකරණය වැඩි දියුණු කිරීම.<br>- කුසලතා සංවර්ධනය හා ශ්‍රම ඵලදායීතාවය : ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම ගැලපුම් කිරීම, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම, ශ්‍රම බලකායේ තරඟකාරිත්වය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සහ ගැටුම් පවතින ප්‍රදේශවල තරුණ රැකියා ප්‍රශ්නය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම.<br>- කම්කරු නීති හා පරිපාටීන්වල නම්‍යභාවය ඉහළ නැංවීම : අවිධිමත් අංශ සඳහා සමාජ ආරක්ෂණය ලබාදීම, රැකියාවල නම්‍යභාවය ඉහළ නැංවීම, සේවා වියුක්තිකයින් සඳහා සමාජ ආරක්‍ෂණ ක්‍රමයක් ලබාදීම, පුද්ගල වයස්ගතවීම ශ්‍රම බලකාය මත ඇති කරනු ලබන බලපෑම පිළිබඳ සැලකිලිමත්වීම සහ ළමා ශ්‍රමිකයින් රැකියාවල යෙදවීම වැළැක්වීමට අවශ්‍ය නිසි පියවර ගැනීම.<br>- සේව්‍ය සේවක සම්බන්ධතාවය ඉහළ නැංවීම: කාර්මික සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ත්‍රෛපාර්ශ්වීය උපදේශනය ජාතික මට්ටමින් ප්‍රමුඛතාගත කිරීම. |
| **විද්‍යා හා තාක්ෂණ :**<br>*ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම, පූර්ණ පරිගණක සාක්‍ෂරතාව හා අවබෝධය, විශිෂ්ඨ විද්‍යා, අධ්‍යාපනය සහ ප්‍රමුඛ විද්‍යා හා තාක්‍ෂණ භූවමාරුව දෙසට ඉදිරියටම යමින් 2007 වන විට දැනුම හා විද්‍යාව මත පදනම් වූ* | - රටේ සෑම පුරවැසියෙකු වෙතම ඵලදායී ලෙස සමීප වන ජාතික විද්‍යා සංස්කෘතියක් පෝෂණය කිරීම<br>- රටේ සංවර්ධන අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය විද්‍යාඥයින් සහ තාක්‍ෂණඥයින්ගෙන් සැදුම්පත් සම්පත් පදනම ගොඩනැගීම, පවත්වාගෙන යෑම හා ක්‍රමානුකූලව වැඩි කිරීම.<br>- අදාළ ක්ෂේත්‍රයන්හි විද්‍යාත්මක හා තාක්‍ෂණික ක්‍රියාකාරකම් පෝෂණය කිරීම.<br>- විද්‍යා හා තාක්‍ෂණ කටයුතුවල මූලික හා ව්‍යවහාරික පර්යේෂණයන් දිරිගැන්වීම.<br>- දේශීය දැනුම හා තාක්‍ෂණ භාවිතය දිරිගැන්වීම හා තවදුරටත් සංවර්ධනය කිරීම.<br>- විද්‍යා හා තාක්‍ෂණය මත පදනම් වූ නවෝත්පාදනයන් හා නව නිපැයුම් දිරිමත් කිරීම හා ත්‍යාග ප්‍රදානයන් සිදුකිරීම සහ බුද්ධිමය දේපල අයිතිය සුරැකීම. |

| | |
|---|---|
| *නවීන සංවර්ධිත රටක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම.* | - ශ්‍රී ලංකාව සහ අනෙකුත් රටවල් අතර විද්‍යා හා තාක්‍ෂණ සහයෝගිතාවය ශක්තිමත් කිරීම හා දිරිමත් කිරීම. |
| **පරිසරය :**<br>*ස්වභාව ධර්මයට එකඟ වූ දේශයක් ගොඩනැංවීම.* | - සියලුම සම්පත් භාවිතා කරන්නන් සමග හවුල් වැඩිදියුණු කිරීම.<br>- රජයට අයත් භූමිවල තිරසාර භූමි භාවිතය දිරිමත් කිරීම.<br>- පෞද්ගලික වන වගාව සහ වෘක්ෂ සම්පත් සංවර්ධනය කිරීම.<br>- වන සම්පත් නිෂ්පාදන, කර්මාන්ත සහ අලෙවිකරණය දියුණු කිරීම.<br>- අන්තර් ආංශික සම්බන්ධතා සඳහා සහයෝගය ලබාදීම. |
| **රාජ්‍ය පරිපාලන ප්‍රතිසංස්කරණ :**<br>*ඵලදායී සහ කාර්යක්‍ෂම, සේවාලාභී සුහදතාවයෙන් යුත්, දූෂණයෙන් තොර විනිවිදභාවයෙන් සහ වගකීමෙන් යුතු රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම.* | - සහයෝගිතා පාලනයක් වෙත යොමුවීම : ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් බලතල සහ වගකීම් පැහැදිලිව නිර්ණය කරන අතර, මෙම මට්ටම් තුන අතර සිදුවන වගකීම්වල ද්විත්වකරණය අවම කිරීම.<br>- ගිවිසුම් කළමනාකරණය පිළිබඳ කුශලතාවය, කාර්යසාධනය ක්‍රමවත් ලෙස මැනීමේ ශිල්ප ක්‍රම, උපාය මාර්ගික සැලසුම් කුශලතා සහ පුරවැසියන්ගේ හඬට සංවේදී වීම වැඩි දියුණු කරමින් සහයෝගිතා රාජ්‍ය සේවාවක් සැපයීම.<br>- කාර්යක්‍ෂම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය : රාජ්‍ය මූල්‍ය විනය, උපාය මාර්ගික අයුරින් සම්පත් වෙන්කිරීම සහ මනා මෙහෙයුම් කළමනාකරණය.<br>- කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් නිර්මාණය කිරීම.<br>- රාජ්‍ය අංශයීය කාර්යසාධනය කාර්යක්‍ෂම ලෙස කළමනාකරණය කිරීම.<br>- පරිපාලන ක්‍රමය වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම : පූර්ණ වශයෙන් සිදුකරනු ලබන ප්‍රතිසංස්කරණ, ආංශික වශයෙන් සිදුවන ප්‍රතිසංස්කරණ හා විශේෂීකරණයට ලක්වූ ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම. |
| **ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය :**<br>*උතුරු නැගෙනහිර ආගන්තුක සත්කාරයෙන් පරිපූර්ණ ආකර්ෂණීය ස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සහ ජනතාවට සාමයෙන් සහ මිත්‍රත්වයෙන් ජීවත්වීමට හැකි පරිසරයක් බිහිකිරීම සහ එතුළින් කඩිනම් සමාජ හා ආර්ථික සංවර්ධනයක් කරා පිවිසිය හැකිවන පරිදි සාමය හා ජනවාර්ගික එකමුතුව ස්ථාපිත කිරීම.* | - ජීවනෝපායයන් ප්‍රතිස්ථාපනය කිරීම.<br>- සේවා පහසුකම් යළි පණගැන්වීම.<br>- යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම.<br>- මානව හැකියාවන් හා ධාරිතාවන් වර්ධනය කිරීම.<br>- දැඩි පීඩාවට පත් පුද්ගලයින් ඉලක්ක කර ඔවුනට ආත්ම ගරුත්වයෙන් යුතුව ජීවත්වීම සඳහා තිරසාර ජීවනෝපාය මාර්ගයක් සලසා දීම.<br>- යහපත් රාජ්‍ය පාලනයක් ස්ථාපිත කිරීම. |